SRI LANKA

# Level 1

## 104

## ව්‍යාපාරික පරිසරය

Business Environment

## (BEN)

## T- 01

**පරිච්ඡේදය** **01**

# ව්‍යාපාර සංකල්ප හා විවිධ වර්ගයේ ව්‍යාපාර සංවිධාන වර්ග

පුද්ගල කණ්ඩායමක උත්සාහයකින් තොරව ඉටු කරගැනීමට අපහසු පරමාර්ථ හා අරමුණු ඉටු කරගැනීම සඳහා මිනිසුන් විසින් සංවිධාන බිහිකරනු ලබයි. ඒ අනුව කිසියම් පොදු අරමුණක් ළඟා කරගැනීම සඳහා එක්ව වැඩකරන පුද්ගල කණ්ඩායමක් සංවිධානයක් යන්නෙන් අදහස් වේ.

**සංවිධාන පිළිබඳව ඉදිරිපත් වී ඇති නිර්වචන**

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

සාමූහික අරමුණු ළඟා කරගැනීමට උත්සුක වන, ස්වකාර්යඵල පාලනය කරනු ලබන සහ එහි පරිසරයෙන් එය වෙන්කරනු ලබන සීමාවක් සහිත සමාජ සැකැස්මකි.

ඉහත නිර්වචන වලට අනුව සංවිධානයක් තුළ දැකිය හැකි මූලිකාංග 03 කි.

1. .............................................................................................................................
2. .............................................................................................................................
3. .............................................................................................................................

අඩුපාඩුකම් සංකීර්ණ වූ පුද්ගල අවශ්‍යතා ඉටුකරගැනීමට බාධාවක් ඇති නොකරන තත්ත්වයක් ඇතිකර ගැනීම කෙරෙහි සංවිධානය වීම වැදගත් වේ.

ඒ අනුව පුද්ගලයින් විසින් සංවිධාන බිහිකිරීමට හේතු වන කරුණු කිහිපයකි.

- තනි පුද්ගල අඩුපාඩුකම් මගහරවා ගනිමින්පුද්ගල කණ්ඩායමක උත්සායකින් තොරව ඉටුකරගත නොහැකි කාර්යය ඉටුකරගැනීමට
- දිනෙන් දින සංකීර්ණ වන පුද්ගල වුවමනාවන් තෘප්තිමත් කිරීම සඳහා නිෂ්පාදිත බිහිකිරීමට
- දැනුම උත්පාදනය කිරීම, සංවර්ධනය කිරීම හා බෙදාහැරීම
- ඒකාබද්ධ අධිඵල වාසි අත්කරගැනීම
- සීමිත සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැනීම

සංවිධාන ඒකාබද්ධ උත්සාහයන් උදෙසා සකස් වී ඇති බැවින් එහි අරමුණු, සේවකයින් ගේ පුද්ගලික අරමුණු ඉක්මවා යන්නේ ය. ඒ අනුව සංවිධානයේ අරමුණු උදෙසා කැපවීම සියළු සේවකයින්ගේ බැඳීම වන්නේ ය. **(හෙන්රි ෆයෝල්)**

## විධිමත් හා අවිධිමත් සංවිධානය

සංවිධාන යන්න මිනිසුන්ගෙන් සමන්විත සමාජීය ඒකකයන් මෙන්ම ආර්ථික ඒකකයන් ද වන්නේ ය. සංවිධාන සකස් වෙන ප්‍රධාන ආකාර දෙකකි.

1. ..............................................................................................................................

   නිශ්චිතව නිර්වචනය කරන ලද ව්‍යුහයකට අනුව පුද්ගලයින් අතර නිර්මාණය වන්නා වූ පුද්ගල කණ්ඩායම් වේ.

   නිදසුන් : - අලෙවිකරණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

2. ..............................................................................................................................

   ..............................................................................................................................

   ..............................................................................................................................

   ..............................................................................................................................

   ..............................................................................................................................

   නිදසුන් : - මිතුරන් කණ්ඩායමක්, වට්ස් ඇප් සමූහ (whatsapp Groups)

## ව්‍යාපාර හා එහි ගති ලක්ෂණ

හැඳින්වීම

සෑම පුද්ගලයකුම එදිනෙදා ජීවිතයේ දී තම වුවමනාවන් ඉටුකරගැනීම සඳහා ව්‍යාපාර හා සම්බන්ධ වනු ඇත. ව්‍යාපාරයක් යනු කුමක් ද? යන්න අවබෝධ කර ගැනීම ඉතා වැදගත් ය.

ඔබට එදිනෙදා ජීවිතයේ දී හමුවන ව්‍යාපාර කටයුතු කිහිපයකට උදාහරණ පහත දැක්වේ.

- ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය ජනතාව කටයුතු කිහිපයකට උදාහරණ පහත දැක්වේ.
- EYE නාලිකාව රසාස්වාදය සඳහා වූ වැඩසටහන් විකාශනය කරයි.
- සෝමසිරි ඉරිදා පොළේ එළවළු විකුණයි.
- Apple සමාගම iphone 11 වෙළෙඳපොළට ඉදිරිපත් කරයි.

  විමල් සිය විවේක කාලය තුල සාමාන්‍ය පෙළේ විභාගයට පෙනීසිටින සිසුන් සඳහා උපකාරක පන්ති පවත්වයි.

ඉහත සිද්ධීන් අනුව ව්‍යාපාර යනු පුද්ගල වුවමනාවන් ඉටු කිරීම සඳහා වූ ක්‍රියාකාරකම් බව ඔබට වැටහෙනු ඇත.

ව්‍යාපාරයක් යන්න ලාභ අපේක්ෂාවෙන් ගනුදෙනුකරුවන්ගේ වුවමනා තෘප්තිමත් කිරීම ලෙස අර්ථකතනය කල ද ලාභ අපේක්ෂාවෙන් තොරව සමාජයේ සුබසාධනය අරමුණු කරගෙන පුද්ගල වුවමනා සපුරාලන ව්‍යාපර ද ජන සමාජය තුල පවතී. කෙසේ වුවද මේ සියළු ව්‍යාපාර කටයුතු සීමිත හිඟ සම්පත් සමාජයේ පුද්ගලයින් අතර වූ අසීමිත වුවමනාවන් වෙනුවෙන් භාවිත කරන බැවින් ඒවා ආර්ථිකමය කටයුතු ලෙස හඳුනා ගැනේ.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

පසු කාලීනව පුද්ගල විශේෂීකරණය මත ඇති වූ අතිරික්තයන් හුවමාරු කර ගැනීමට යොමු වී ඇත. එසේ භාණ්ඩයකට භාණ්ඩයක් හුවමාරු කර ගැනීම බාටර් ක්‍රමය ලෙස හැඳින්වෙන අතර බාටර් ක්‍රමය තුල ඇති වූ ගැටලු හා දුෂ්කරතා නිසා මුදල් භාවිතා කිරීම ආරම්භ කර ඇති අතර ඒ සමඟම ලෝකයේ ප්‍රයෝජනයට ව්‍යාපාර ලක් වී ඇත. එසේම වෙළෙඳ කටයුතු වල දී ව්‍යාපාරිකයින්ට හා පාරිභෝගිකයින්ට ඇති වන අපහසුතා මග හැරවීමට බැංකු, රක්ෂණය, ගබඩාකරණය වැනි උපකාරක සේවා බිහිවීම සිදු වී ඇති අතර 18 වන සියවසේ අගභාගයේ දී යුරෝපීය රටවල පැති ගිය කාර්මික විප්ලවයහේතුවෙන් ව්‍යාපාර ක්ෂෙත්‍රයේ විශාල වෙනස්කම් රාශියක් සිදු විය. එම වෙනස්කම් පහත පරිදි ලැයිස්තුග කල හැකිය.

# කාර්මික විප්ලවයේ ප්‍රතිඵල

## නිෂ්පාදන ක්ෂේත්‍රය

1. ..........................................................................................................................

2. ..........................................................................................................................

3. ..........................................................................................................................

3. යන්ත්‍රෝපකරණ භාවිතය නිසා මහා පරිමාණ කර්මාන්ත බිහිවීම

5. ශ්‍රම විභජනය හා විශේෂීකරණය ව්‍යාපාර කටයුතු වලදී භාබිත කිරීම


6. ස්වයං පරිභෝජනය වෙනුවට වෙළෙඳපොළ සඳහා නිෂ්පාදනය කිරීම

# වාණිජ ක්ෂේත්‍රය

- ..........................................................................................................................
- ..........................................................................................................................
- ප්‍රවාහන ක්‍රම වල (මහාමාර්ග, දුම්රිය, ජල) ඇතිවූ දියුණුව
- දේශීය වශයෙන් පැවති වෙළෙඳාම අන්තජාතික වෙළෙඳාමක් ලෙසට ව්‍යාප්ත වීම.

20 වන සියවසේ අගභාගය හා 21 වන සියවසේ ආරම්භයත් සමග විද්‍යුත් හා සන්නිවේදන තාක්ෂණයේ ඇතිවූ තොරතුරු ආර්ථිකය හේතුවෙන් ව්‍යාපාර කටයුතු ඉතා සීඝ්‍ර වශයෙන් වෙනස් වූ අතර එසේ සිදු වූ වෙනස්කම් අතර පහත දෑ හඳුනාගත හැකිය.

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හේතුවෙන් වෙළෙඳපොළ ස්ථානය වෙළෙඳපොළ අවකාශය බවට ක්‍රමයෙන් පරිවර්තනය වීම
- දේශීය ව්‍යාපාර ගෝලීය ව්‍යාපාර බවට පත්වීම
- ඩිජිටල් ව්‍යාපාර හරහා ඩිජිටල් භාණ්ඩ වෙළෙඳාම් වීම
- විද්‍යුත් මුදල් භාවිතයට පැමිණීම
- විද්‍යුත් ව්‍යාපාර සහ විද්‍යුත් වාණිජ්‍ය වැනි සංකල්ප බිහිවීම



# විධිමත් ව්‍යාපාරයක ගති ලක්ෂණ

ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා ස්ථාපිත සංවිධානයක් ව්‍යාපාර ආයතනයක් යන්නෙන් අදහස් වේ.

විධිමත් ව්‍යාපාර වලට පොදු ගති ලක්ෂණ කිහිපයකි.

01. ..........................................................................................................................................

ව්‍යාපාර සංවිධානයකට අරමුණක් හෝ අරමුණු සමූහයක් ඇත. මෙම අරමුණු ලඟාකරගැනීම සඳහා සංවිධාන සතුව ඇත්තේ සීමිත සම්පත් ප්‍රමාණයකි. එබැවින් ඕනෑම ව්‍යාපාර සංවිධානයක් තුල ආර්ථික ක්‍රියාවලියක් සිදුවේ. ඒ අනුව සංවිධානයක් යනු ආර්ථික ඒකකයකි. එනම් මිලක් (ප්‍රතිෂ්ටාවක්) මත පදනම්ව කටයුතු සිදුවීම අත්‍යාවශ්‍ය වේ. එනම්. නිෂ්පාදනය, බෙදාහැරීම හා පරිභෝජනය සම්බන්ධ ඕනෑම කටයුත්තක් ආර්ථික කටයුත්තකි. එම කටයුතු ඉටු කිරීම ව්‍යාපාරයක අනිවාර්ය ලක්ෂණයකි. .

02. ..........................................................................................................................................

ව්‍යාපාරයක ප්‍රාථමික කටයුත්ත ලෙස මිලදී ගැනීමේ හා විකිණීමේ කටයුතු (වෙළෙඳාම) සිදුවේ. අමුද්‍රව්‍ය, යන්ත්‍ර, ලිපිද්‍රව්‍ය යනාදිය ව්‍යාපාර විසින් මිලදී ගන්නා අතර තොග වෙළෙඳුන්, සිල්ලර වෙළෙඳුන්, පාරිභෝගිකයින් යනාදී පාර්ශවයන්ට අලෙවි කිරීමෙහි නිරත වේ. එනම්, ඕනෑම ව්‍යාපාරයක් මිලදී ගැනීම සේ ම විකිණීම සිදු කරන අතරම ඒවා විවිධ පාර්ශ්ව අතර හුවමාරු වේ.

03. ..........................................................................................................................................

ව්‍යාපාරයක කාර්යය එකවරක් පමණක් සිදුකරන කටයුත්තක් නොවේ. එය භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමේ හා බෙදාහැරීමේ අඛණ්ඩව ක්‍රියාවලියකි. එසේම, ව්‍යාපාර ලාභය ම මත සිය අරමුණු රඳා නොපවතී. විවිධ ප්‍රතිලාභ අයිතිකරුවන් අපේක්ෂා කිරයි. එම ප්‍රතිලාභ ලැබීම අභිප්‍රේරණයට හේතුවකි.

04. ..........................................................................................................................................

ව්‍යාපාරයක  සාර්ථක අසාර්ථකභාවය පෙන්නුම් කරන දර්ශකය ලාභයයි. භාණ්ඩ හා සේවා විකිණීම හරහා උපරිම ලාභයක් ඉපයීම ව්‍යාපාරයක ප්‍රාථමික ඉලක්කයයි. එසේම, ව්‍යාපාර ලාභය ම මත සිය අරමුණු රඳා නොපවතී. විවිධ ප්‍රතිලාභ අයිතිකරුවන් අපේක්ෂා කරයි. එම ප්‍රතිලාභ ලැබීම ද අභිප්‍රේරණයට හේතුවකි.

### 05. අවදානමක් සහ අවිනිශ්චිතතාවයක් පැවතීම

අවදානම යනු ව්‍යාපාර අරමුණු ඉටු කර ගැනීමට එරෙහිව පවතින අවිනිශ්චචිත තත්ත්වයන්ය. එනම් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වීමේ සම්භාවිතාවයයි. මෙය ව්‍යාපාරයන්හි පවතින නෛසර්ගික අතත්ත්වයකි. මෙවැනි අවිනිශ්චිතතා මෙන්ම අවදානම් ඇති වීම සඳහා ව්‍යාපාර පරිසරයේ පවතින විවිධ බලවේග මෙන්ම තත්ත්ව බලපායි. එම සාධක අතර ව්‍යාපාරයේ අභ්‍යන්තර පාර්ශ්ව හා තත්ත්ව ආසන්න පරිසරයේ මෙන්ම සාර්ව පරිසර සාධක ද බලපායි.

### 06. වුවමනා නිර්මාණය කිරීම හෙවත් නිර්මාණශීලී බව

වෙනස් වන ව්‍යාපාරික පරිසරයන්ට අනුගත වෙමින් නව්‍යතාවනයන් බිහිකරනු ලබන ඒකකයකත් බව මින් අදහස් වෙවි ඒ අනුව මිනිස් අවශ්‍යතාවන් සඳහා නිෂ්පාදිත නිර්මාණය කරනු ඒකකයන් ලෙස ව්‍යාපාර හඳුනාගත හැකිය. එය ක-මන නිෂ්පාදිත සිය පාරිභෝගිකයාට අවශ්‍ය වේ දැයි නිර්ණය කිරීමත්, ඒවා නිපදවීමත් අවශ්‍ය අවස්ථාවේ දී අවශ්‍ය ස්ථානයේ දී ලබාදීමත් තීරණය කිරීම ව්‍යාපාර විසින් සිදු කරනු ලැබීම එහි ගති ලක්ෂණයකි.

## ව්‍යාපාරය හා බැඳුණු සංකල්ප

ව්‍යාපාර අවබෝධ කර ගැනීමේ දී පැහැදිලිව වටහාගත යුතු සංකල්ප පිළිබඳව අධ්‍යයනය කිරීම වැදගත් වේ. ව්‍යාපාර සංකල්පය හා බැඳුනු එවැනි සංකල්ප කිහිපයක් පහතින් දැක්වේ.

- අවශ්‍යතා සහ වුවමනා
- හුවමාරුව හා ගනුදෙනුව
- ගනුදෙනුකාර අගය හා තෘප්තිය
- නිෂ්පාදනය හා නිෂ්පාදිතය
- අනාගත අපේක්ෂාවන්
- ඉල්ලුම
- පාරිභෝගිකයා සහ ගනුදෙනුකරු
- ව්‍යාපාරික සම්පත්
- වෙළෙඳපොළ
- උපාය මාර්ග


# අවශ්‍යතා සහ වුවමනා

## මිනිස් අවශ්‍යතා

අවශ්‍යතා යනු මිනිසා විසින් ජීවත් වීම උදෙසා අනිවාර්යයෙන්ම සපුරාගත යුතු කායික හා මානසික තත්ත්ව වේ. සෑම පුද්ගලයෙකුටම අත්‍යාවශ්‍ය වන ආහාර, ජලය, ඇඳුම්, නිවාස යනාදිය අවශ්‍යතා ලෙස හඳුනාගත හැකිය. පිලිප් කොට්ලර් විසින් නිර්වචනය කරන ආකාරයට කිසියම් මූලික තෘප්තියක් නොලැබීමෙන් දැනෙන හිඟතාවයක් හෙවත් අඩුපාඩුවක් පිළිබඳ හැඟීම අවශ්‍යතාවක් වේ.

## අවශ්‍යතා ආවලිය / අවශ්‍යතා ධූරාවලිය

මිනිසා විසින් අවශ්‍යතා සපුරා ගැනීමට පෙළෙඹෙන ආකාරය මත අවශ්‍යතා ආවලියක පිහිටන බව ඒබ්‍රහම් මැස්ලෝ ගේ අවශ්‍යතා ආවලි න්‍යාය මගින් පැහැදිලි කරයි. ඒ අනුව අවශ්‍යතා වර්ග 5 ක් පවතී.




## වුවමනා

අවශ්‍යතාවයක් සපුරාගැනීමේ විවිධ මාර්ග නැතහොත් විකල්ප ක්‍රම වුවමනා ලෙස හැඳින්වේ. එය කිසියම් අවශ්‍යතාවක් තෘප්තිමත් කිරීම සඳහා කිසියම් භාණ්ඩයකට හෝ සේවාවකට ඇති පුද්ගල කැමැත්ත ලෙස අර්ථ දැක්විය හැකිය. භාණ්ඩ හා සේවා පරිභෝජනයට මිනිසා තුල හටගන්නා අසීමිත කැමැත්ත වුවමනා යන්නෙන් අදහස් වේ.

**අවශ්‍යතා සහ වුවමනා සැසඳීම**

| පදනම | අවශ්‍යතා | වුවමනා |
|---|---|---|
| අර්ථය | ජීවත්වීමට අනිවාර්යය වන කායික හා මානසික තත්ත්ව වේ | භාණ්ඩ හා සේවා සඳහා වන පුද්ගල කැමැත්තයි |
| ස්වභාවය / ප්‍රමාණය | සීමිතයි | අසීමිතයි |
| කුමක් ද යන්න | පුද්ගලයින් තෘප්තිමත් කරගතයුතු තත්ත්වයයි | පුද්ගලයින් තෘප්තිමත් කර ගැනීමට කැමති තත්ත්වයයි |
| ජීවිත්වීම හා සම්බන්ධය | අත්‍යාවශ්‍යවේ | අත්‍යාවශ්‍ය නොවේ |
| වෙනස් වීම | ස්ථාවරව පවතී | කාලය සමඟ වෙනස්වේ |
| සපුරා නොගැනීමේ ප්‍රතිඵලය | රෝගයකට හෝ මරණයට හේතු වේ | අපේක්ෂා භංගත්වයට හේතු වේ. |
| අදාල වීම | සියළු දෙනාට පොදු වේ | පුද්ගලයා අනුව වෙනස් වේ. |
| ඇතිවීම | ප්‍රාථමිකයි (පළමුව ඇති වේ) | ද්විතීයිකයි (දෙවනුව ඇති වේ) |
| කාර්යභාරය | ජීවිතය පවත්වා ගැනීම | ජීවන තත්ත්වය උසස් කිරීම |
| බිහිවීම | ජීව විද්‍යාත්මකයි | ව්‍යාපාරිකයින් විසින් නිර්මාණය කරයි. |
| සපුරාගැනීමට බලපෑම් කිරීමේ හැකියාව | සමාජ බලවේග මගින් වෙනස් කළ නොහැක | සමාජ බලවේග මගින් වෙනස් කළ හැක |

රටක ජනතාවගේ ජීවන තත්ත්වය තීරණය වීම කෙරෙහි අවශ්‍යතා වුවමනාවන් සෘජුව සම්බන්ධ වන අතර ඉහළ ජීවන තත්ත්වයක් පවතින රටවල පුද්ගලයින් ඉහළ වටිනාකමක් සහිත ඉහළ ගුණත්වයෙන් යුතු වුවමනාවන් පරිභෝජනය කරන අතර පහළ ජීවන තත්ත්වයක් පවතින රටවල පුද්ගලයසින් පහළ මට්ටමේ වුවමනාවන් පරිභෝජනය කරනු ලබයි. එසේ ඉහළ ජීවන තත්ත්වයක් පවතින රටවල් මොනවාද යන්න ජීවිතයේ ගුණාත්මකභාවය හෙවත් මානව තෘප්තියේ මට්ටම මනිනු ලබන දර්ශකය වන ජීවත් වීමට වඩාත් සුදුසුම ස්ථාන දර්ශකය මගින් හඳුනා ගැනීම සිදුවේ. 2019 වර්ෂයේ දී ශ්‍රී ලංකාව මෙම දර්ශකයේ 64 වන ස්ථානය හිමිකරගත් අතර දර්ශකයේ අගය 5.71 විය සුරික්, ස්විස්ටර්නලන්තය (8.22), ඕස්ටේලියා (8.12), නෝර්වේ (8.09), ස්වීඩන් (8.02), නවසීලන්තය (7.95), නෙදර්ලන්තය (7.94), කැනඩා (7.81) වැනි රටවල් මෙම දර්ශකයේ ඉහළම අගයන් ලබා ගන්නා රටවල් වේ.

පහත සාධක මත වුවමනා පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වේ.

1. ස්ත්‍රී පුරුෂ භාවය
2. වයස
3. ආර්ථික මට්ටම (ආදායම)
4. සංස්කෘතිය
5. පරම්පරාව
6. අධ්‍යාපන මට්ටම

- **ඉල්ලුම**

  මිලදී ගැනීමේ හැකියාව මත පදනම් වූ වුවමනාවක් ඉල්ලුම ලෙස සැලකේ. පුද්ගලයින්ගේ මිලදී ගැනීමේ හැකියාව යනු ක්‍රය ශක්තිවයයි. පුද්ගලයෙකු සතු වැය කළ හැකි ආදායම මත ක්‍රය ශක්තිය තීරණය වේ. එසේම මිලදී ගැනීමේ සූදානමක් පැවතීමද අත්‍යාවශ්‍ය සාධකයක් වේ. ව්‍යාපාර ආයතනයකට වැදගත් වන්නේ එක් පුද්ගලයෙකුගේ ඉල්ලුමක් නොව ප5මාණවත් පිරිසකගේ ඉල්ලුමකි. එවැනි ප්‍රමාණවත් පිරිසක් අතර මිලදී ගැනීමේ කැමැත්තක්, මිලදී ගැනීමේ හැකියාවක්, මිලදී ගැනීමේ සූදානමක් යන කොන්දේසි 03 ම සම්පූර්ණ වූ තත්ත්වයක් සඵල ඉල්ලලුක් ලෙස හැඳින්වේ.

- **හුවමාරුව හා ගනුදෙනුව**

  ඉහත සඳහන් කළ ආකාරයට පුද්ගලියන් විධිමත් ආකායට අවශ්‍යතා සපුරා ගන්නා ප්‍රධානතම ආකාරය වන්නේ වෙළෙඳපොළ ක්‍රමයයි. මෙහිදී මිනිසා විසින් සිය අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා වෙනත් පාර්ශවයකින් ලබා ගැනීමට තමන් සතුව ඇති වටිනා යමක් ප්‍රධානය කිරීම සිදු කරයි. එය ද්වීපාර්ශවීය එකඟත්වයක් මත සිදුවන ගනුදෙනුවකි. ඒ අනුව සෑම විටම හුවමාරුවක් සම්පූර්ණ වීටම අනිවාර්යයෙන් පැවතිය යුතු අවශ්‍යතා කිහිපයකි.

  1. ..............................................................................................................................
  2. ..............................................................................................................................
  3. ..............................................................................................................................
  4. ..............................................................................................................................
  5. ඒක ඒක පාර්ශවයට හුවමාරුව පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට නිදහස තිබිය යුතු වීම
  6. පාර්ශවයන් අතර අන්‍යෝන්‍ය විශ්වාසකයක් පැවතීම.

- **පාරිභෝගිකයා සහ ගනුදෙනුකරු**

  පාරිභෝගිකයා යනු ස්වකීය අවශ්‍යතා වුවමනා තෘප්තිත් කර ගැනීම පිණිස භාණ්ඩ හා සේවා පරිභෝජනය කරන්නායි. වෙළෙඳපොළ තුළින් භාණ්ඩ හා සේවා මිලට ගන්නා සෑම කෙනෙකුම ගනුදෙනුකරුවෙකි.

  පුළුල් වශයෙන් දක්වන්නේ නම් භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට අදහස් දෙන්නා, පොළඹවන්නා, තීරණය කරන්නා, මිලදී ගන්නා හො පාරිභෝජනය කරන්නා යන ඕනෑම පුද්ගලයෙකු ගනුදෙනුරුවෙකු විය හැකිය. සමහර අවස්ථා වලදී ගනුදෙනුකරු සහ පාරිභෝගිකයා එකම පුද්ගලයෙකු විය හැකි අතර සමහර අවස්ථා වලදී පුද්ගලයන් දෙදෙනෙකු විය හැකිය.

  උදාහරණ ලෙස ඔබගේ පෞද්ගලික පරිහරණයට පොතක් මිලදී ගත් විට ඔබ පාරිභෝගිකයෙකු මෙන්ම ගනුදෙනුකරුවෙකු ද වේ. එහෙත් මවක් කිරිපිටි පැකට්ටුවත් මිලදී ගෙන ඇයගේ ළදරුවාට දුන්නේ නම් එහිදී මව ගනුදෙනුකරු වන අතර ළදරුවා පාරිභෝගිකයා වේ.

  පුළුල් අර්ථයට අනුව ගනුදෙනුකරුවන් අභ්‍යන්තර හා බාහිර ලෙස කොටස් දෙකකට බෙදිය හැකි අතර කිසියම් ආයතනයක සියළුම සාමාජිකයන් එහි අභ්‍යන්තර ගනුදෙනුකරුවන් වේ. ව්‍යාපාරය සමග කටයුතු කරන බාහිර පාර්ශවයන් බාහිර ගනුදෙනුකරුවන් ලෙස හැඳින්වේ.

- **ගනුදෙනුකාර වටිනාකම / අගය**

  යම් භාණ්ඩයක් හෝ සේවයක් හිමිකර ගැනීම සහ උපයෝජනය තුළින් පාරිභෝගිකයා අත්කර ගන්නා විවිධ ප්‍රයෝජනයන්ගේ වටිනාකමත්, අදාළ නිෂ්පාදිතය අත්කරගැනීම ඔහු හෝ ඇය විසින් දරනු ලබන පිරිවැයත් අතර වෙනස පාරිභෝගික අගය වේ. නිෂ්පාදිතයක ගුණත්වය, සේවාවන් සහ මිල යන සාධක වල සංයෝගයෙන් නිෂ්පාදිත වටිනාකම තීරණ වේ. මෙම පාරිභෝගික අගය වඩාත් නිවැරදිව හා විෂයානුපද්ධව ගණනය කරගැනීම දුෂ්කර කාර්යයකි. එම නිසා පාරිභෝගිකයා විසින් තමාට පහසුවන හා ගෝචර වන ආකාරයකට මෙම වටිනාකම තීරණය කරයි. පාරිභෝගිකයා මත පදනම්ව තීරණය වන මෙම අගය සංජානනය කළ අගය ලෙස හැඳින්වේ. පාරිභෝගිකයෙකුගේ සංජානනයන් මත විවිධාකාරයෙන් බලපෑම් ඇති කරමින් සිය නිෂ්පාදිතය කෙරෙහි ඉහළ පාරිභෝගික අගයක් පවත්වාගෙන යාම දක්ෂ ව්‍යාපාරිකයෙකුගේ අපේක්ෂාවයි. ඒ අනුව සිය නිෂ්පාදිතයන්ගේ වෙළෙඳපොළ තුළ සාර්ථකව ස්ථාපිත කිරීම සඳහා ව්‍යාපාරිකයෙකුට පාරිභෝගිකයන්ගේ සංජානනයන් වැදගත් වේ. එසේම ඉල්ලුම හා විකුණුම් ඉහළ නංවාලීමට, විකුණුම් වියදම් අඩු කිරීමට, ව්‍යාපාරයේ දිගුකාලීන පැවැත්ම තහවුරු කර ගැනීමට, ආයතනයේ කීර්තිනාමයට හා ප්‍රතිරූපය වර්ධනය කර ගැනීමට සහ වෙළෙඳපොළ තුළ නිෂ්පාදිතය නිවැරදි ලෙස ස්ථාන ගත කිරීමට පාරිභෝගික සංජානනයන් වැදගත් වේ.

- **ගනුදෙනුකාර තෘප්තිය**

  කිසියම් නිෂ්පාදියකින් සිය අපේක්ෂාවන් ඉටු වීම පිළිබඳව පාරිභෝගිකකෙයකු හෝ ගනුදෙනුකරුවකු තුල ඇතිවන හැඟීම තෘප්තිය යන්නෙන් අදහස් වෙව් තෘප්තියේ අවස්ථා 03 කි.

  1. අතෘප්තිමත් අවස්ථාව (අපේක්ෂාව > නිෂ්පාදිතයේ කාර්යය සාධනය)
  2. තෘප්තිමත් අවස්ථාව (අපේක්ෂාව = නිෂ්පාදිතයේ කාර්යය සාධනය)
  3. උද්දාමයට පත්වන අවස්ථාව (අපේක්ෂාව < නිෂ්පාදිතයේ කාර්යය සාධනය)

  ඒ අනුව ගනුදෙනුකරුවන් උද්දාමයට පත්කිරීම සඳහා වර්තමාන ව්‍යාපාරිකයින් විසින් වර්ධිත මට්ටමේ හෝ විභව මට්ටමේ නිෂ්පාදිත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

- **ව්‍යාපාර සම්පත්**

  ව්‍යාපාරික සම්පත් හෙවත් නිෂ්පාදන සාධක යනු භාණ්ඩ හා සේවා නිෂ්පාදන ක්‍රියාවලියේ දී යෙදවුම් වශයෙන් යොදාගන්නා ඕනෑම දෙයකි.

  මෙම සම්පත් විවිධාකාරයෙන් වර්ග කෙරෙන අතර ඉන් වර්ගීකරණ කිහිපයක් පහත පරිදි වේ.

  1. ආර්ථික විද්‍යා වර්ගීකරණය
     1. ................................... : ස්වභාව ධර්මයෙන් ලැබෙන සියළුම දෑ
     2. ................................... : පුද්ගලයින් විසින් සපයන කායික හා මානසික උත්සාහයන්
     3. ................................... : මිනිසා විසින් සකස්කරගත් උපකරණ
     4. ................................... : අවදානම් දරමින් සම්පත් සංවිධානය කිරීම

  2. ව්‍යාපාර කළමනාකරණයේ දී සම්පත් පහත අයුරින් දැක්විය හැකිය.

     1. ....................................................................................................
     2. ....................................................................................................
     3. ....................................................................................................
     4. ....................................................................................................
     5. ....................................................................................................

### 3. M5, M7 සහ M9 වර්ගීකරණය

| M5 | M7 | M9 |
|---|---|---|
| Men - මිනිසුන්<br>Machine – යන්ත්‍ර<br>Money – මුදල්<br>Material – ද්‍රව්‍ය<br>Methods – ශිල්ප ක්‍රම | Men - මිනිසුන්<br>Machine – යන්ත්‍ර<br>Money – මුදල්<br>Material – ද්‍රව්‍ය<br>Methods – ශිල්ප ක්‍රම<br>Minutes – කාලය<br>MIS- (Management Information System)<br>– තොරතුරු පද්ධති | Men - මිනිසුන්<br>Machine – යන්ත්‍ර<br>Money – මුදල්<br>Material – ද්‍රව්‍ය<br>Methods – ශිල්ප ක්‍රම<br>Minutes – කාලය<br>Market – වෙළඳපොල<br>Motivation – අභිප්‍රේරණය<br>MIS – තොරතුරු පද්ධති |

භූමිය හෙවත් ස්වාභාවික සම්පත් පහත පරිදි කොටස් දෙකකට බෙදේ.

1. සීමිත එහෙත් නැවත අළුත්කල හැකි සම්පත්

   උදාහරණ - වනාන්තර, මත්ස්‍යයින්

2. සීමිත එහෙත් නැවත අළුත්කල නොහැකි සම්පත්

   උදාහරණ - දියමන්ති, ගල් අඟුරු, ඛනිජ තෙල්

ශ්‍රමය යන්න කොටස් තුනකින් සමන්විත වේ. නුපුහුණු ශ්‍රමය, අර්ධ පුහුණු ශ්‍රමය හෙවත් විශේෂ පුහුණුවක් අවශ්‍ය නොවන රැකියාවන් සඳහා බහුලව යොදාගන්නා ශ්‍රමය, පුහුණු ශ්‍රමය හෙවත් කිසියම් ප්‍රමාණයක විශේෂ පුහුණුවක් අවශ්‍ය රැකියාවන් සඳහා වන ශ්‍රමය සහ වෘත්තීයමය හා කළමනාකාරීත්ව ශ්‍රමය හෙවත් ඉතා ඉහළ දැනුමක් හා පළපුරුද්දක් අවශ්‍ය කළමනාකරණමය රැකියාවන් සඳහා වන ශ්‍රමය එම කොටස් තුනයි.

ප්‍රාග්ධනය යන්න ද ස්ථාවර හා කාරක ප්‍රාග්ධනය ලෙස කොටස් දෙකකට බෙදේ. ගොඩනැගිලි යන්ත්‍රාගාර යනාදිය ස්ථාවර ප්‍රාග්ධනය ලෙස හැඳින්වෙන අතර මුදල්, තොග හා බැංකු ශේෂය යනාදිය කාරක ප්‍රාග්ධනය ලෙස හැඳින්වේ.

ව්‍යවසායකත්වය යන්න අවදානම් දරමින් නව්‍යතා බිහිකිරීම සඳහා අනෙකුත් ව්‍යාපාරික සම්පත් මෙහෙයවීම ලෙස හැඳින්වෙන අතර ව්‍යවසායකත්වය පිළිබඳව වැඩිදුර තොරතුරු 07 වන පරිච්ඡේදයේ දී සාකච්ඡා කෙරේ.

දැනුම යනු ව්‍යාපාර ආයතනයක් සතු බුද්ධිමය එකතුවයි. එනම් ව්‍යාපාරයේ සේවකයින්ගේ දක්ෂතා සහ කුසලතා වල එකතුව මින් අදහස් වේ.

දැනුමේ ප්‍රධාන ආකාර දෙකකි.

### නිශ්චිත / ප්‍රකාශිත දැනුම

විධිමත් භාෂාවකින් ප්‍රකාශිත හා වාර්තාගත දැනුමයි. මෙම දැනුම සම්ප්‍රේෂණය කිරීමට හා ගබඩා කිරීමට හැකියාවක් ඇත.

### ව්‍යංග දැනුම

පුද්ගලයින් තුළ පවතින දැනුමයි. මෙම දුනම සම්ප්‍රේෂණය කිරිමට හා ගබඩා කිරීමට අපහසුය. අත්දැකීම් හරහා පුද්ගලයින් මෙම  දැනුම ලබා ගන්නා නිසා පුද්ගල විශ්වාසයන්, දැක්ම, වටිනාකම් යනාදිය මත මෙම දැනුම වෙනස් වේ.

## නිෂ්පාදනය හා නිෂ්පාදිතය

සම්පත් නොහොත් යෙදවුම් පුද්ගල අවශ්‍යතා වුවමනා සපුරාලන භාණ්ඩ හා සේවා බවට පරිවර්තනයක කිරීමේ ක්‍රියාවලිය නිෂ්පාදනය වේ. ඒ අනුව නිෂ්පාදන සාධක වලට පුද්ගල අවශ්‍යතා වුවමනා තෘප්තිමත් කිරීමේ හැකියාව ලබාදීමේ ක්‍රියාවලිය නිෂ්පාදනය යන්නෙන් අදහස් වේ.

කිසියම් පුද්ගලයෙකු සිය අවශ්‍යතා වුවමනා වෙනුවෙන් තමා විසින්ම නිෂ්පාදිත බිහිකිරීමක්, එනම් ස්වයං පරිභෝජනයක් උදෙසා සිදුකරන නිපදවීමක් සිදු කරන්නේ නම් එය සෘජු නිෂ්පාදනය ලෙසත්, වෙනත් පාර්ශවයන්ගේ අවශ්‍යතා වුවමනා තෘප්තිමත් කිරීම වෙනුවෙන් නිෂ්පාදිත බිහිකිරීමක්, එනම්, වෙළෙඳපොළ උදෙසා නිපදවීමක් සිදු කරන්නේ නම් එය වක්‍ර නිෂ්පදානය ලෙසත් හැඳින්වේ.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

ද්විතීයික නිෂ්පාදනය යනු අමුද්‍රව්‍ය නිමි භාණ්ඩ බවට පරිවර්තනය කිරීම මගින් නිෂ්පාදිත බිහිකිරීමයි. සම්පත් වල ස්වරූපය වෙනස් කරමින් නිෂ්පාදිත බිහිකිරීම මෙහිදී සිදු වේ. නිමවුම් කර්මාන්ත (සැකසුම් / එකලස්) සහ ඉදිකිරීම් කර්මාන්තය මේ යටතට ගැනේ. තෘතීයික නිෂ්පාදනය යනු අස්පෘශ්‍ය නිෂ්පාදිත එනම් පුද්ගලයන්ට සහ ව්‍යාපාර වලට වුවමනා සේවා සැපයීම වේ. වෙළෙඳාම, උපකාරක සේවා වලින් මෙය සමන්විත වේ

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාර්ෂිකව ප්‍රකාශයට පත් කරන වාර්තාවට අනුව දළ දේශීය නිෂ්පාදිතය එකතු කල අගය පදනමට ගණනය කෙරෙන අතර එහිදී නිෂ්පාදිතය කෘෂි ආර්ථික කටයුතු, කාර්මික ආර්ථික කටයුතු සහ සේවා ආර්ථික කටයුතු ලෙස වර්ග කෙරේ.

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

කෙසේ වුවත් පුළුල් ලෙස සලකා බලන විට නිෂ්පාදිතය යන්න පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා වුවමනා ඉටුකල හැකි වටිනාකම් සමුච්චයක් ලෙස හැඳින්වේ.

නිෂ්පාදිතය මූලිකව අස්පෘෂ්‍ය වශයෙන් කොටස් දෙකකට බෙදෙන අතර ස්පෘෂ්‍ය නිෂ්පාදිත භාබ්ඩ ලෙසත් අස්පෘෂ්‍ය නිෂ්පාදිත සේවා ලෙසත් හැඳින්වේ. නමුත් සමහර නිෂ්පාදිත 100% ක් ස්පෘෂ්‍ය හෝ අස්පෘෂ්‍ය  නිෂ්පාදිත සේවා ලෙසත් හැඳින්වේ. නමුත් සමහර නිෂ්පාදිත 100% ක් ස්පෘෂ්‍ය හෝ අස්පෘෂ්‍ය නොවන අවස්ථා ද පවතී. ඒ අනුව ස්පෘෂ්‍ය මෙන්ම අස්පෘෂ්‍ය ලක්ෂණ ද සහිත නිෂ්පාදන නිෂ්පාදිත සන්තානයේ මැද කොටසේ දී හඳුනාගත හැකිය.

උදාහරණ ලෙස වෛද්‍ය සේවාව අස්පෘෂ්‍ය නිෂ්පාදිතයක් වුවත් ඒ තුල බෙහෙත් නැමැති භෞතික නිෂ්පාදිත ද අඩංගු වේ. 100% ක් භෞතික වන නිෂ්පාදිත භාණ්ඩ ලෙස හඳුනා ගන්නා අතර භෞතික නොවන ක්‍රියාකාරකම් සේවා ලෙස හඳුනා ගනී.

භාණ්ඩ හා සේවා අතර වෙනස්කම් පහත පරිදි වේ.

| **භාණ්ඩ** | **සේවා** |
|---|---|
| .................................................................. | .................................................................. |
| .................................................................. | .................................................................. |
| ..................................................................<br>.................................................................. | ..................................................................<br>.................................................................. |
| ගබඩාකර පසුව ප්‍රයෝජනයට ගත හැකිය. | ගබඩාකර පසුව ප්‍රයෝජනයට ගත නොහැකිය. |
| භාබ්ඩ සම්බන්ධ පාරිභෝගික සම්බන්ධතා පහළ මට්ටමක පවතී. | සේවා සම්බන්ධ පාරිභෝගික සම්බන්ධතා ඉහළ මට්ටමක පවතී |
| නිපදවීමට වැඩි වශයෙන් ප්‍රාග්ධනය භාවිත වේ. | නිපදවීමට වැඩි වශයෙන් ශ්‍රමය භාවිත වේ. |
| හිමිකම පවරාදිය හැකිය | හිමිකම පවරාදිය නොහැකිය. |
| බොහෝ විට සෑම අයිතමයකම ගුණාත්වය සමාන වේ. | සේවා සපයන අවස්ථාව පුද්ගලයා අනුව ගුණාත්වය වෙනස් වේ. |
| ප්‍රමාණාත්මකව මැනීම පහසු වේ. | ගුණාත්මකව මැනීම පහසු නැත. |
| නිෂ්පාදනය සඳහා පාරිභෝගිකයා සම්බන්ධ නොවේ. | නිෂ්පාදනය සඳහා පාරිභෝගිකයා සම්බන්ධ වේ. |
| මිලදී ගත් භාණ්ඩ ආපසු ලබා දිය හැකිය. | මිලදී ගත් සේවා ආපසු ලබා දිය නොහැකිය. |

භාවිතයට අනුව නිෂ්පාදිත පාරිභෝගික භාණ්ඩ හා ව්‍යාපාරික / කාර්මික භාණ්ඩ ලෙස කොටස් දෙකකට බෙදනු ලබන අතර පාරිභෝගිකයින් විසින් අවසාන පාරිභෝජනය අරමුණු කරගනිමින් වෙළෙඳපොළ තුලින් මිලදී ගන්නා නිෂ්පාදිත පාරිභෝගික භාණ්ඩ නැතහොත් පාරිභෝගික නිෂ්පාදිත ලෙසත් ව්‍යාපාරිකයින් විසින් වෙනත් භාණ්ඩ හා සේවා නිර්මාණය කිරීම සඳහා වෙළෙඳපොළ තුලින් මිලදී ගන්නා නිෂ්පාදිත ව්‍යාපාරික / කාර්මික භාණ්ඩ නැතහොත් ව්‍යාපාරික / කාර්මික නිෂ්පාදිත ලෙස හැඳින්වේ.

මිලදී ගැනීමට පාරිභෝගිකයින් දරනු ලබන ප්‍රයත්නය නැතිනම් හැසිරීම අනුව පාරිභෝගික භාණ්ඩ වර්ගීකරණය පහත පරිදි වේ.

1. ..........................................................................................................................
2. ..........................................................................................................................
3. ..........................................................................................................................
4. ..........................................................................................................................

## පහසු භාණ්ඩ

මිලට ගැනීමට ඉතා සුළු ප්‍රයත්නයක් දරන පාරිභෞගිකයා එදිනෙදා නිරන්තරයෙන් මිලදී ගන්නා භාණ්ඩ වේ.

මෙම භාබ්ඩ මිලදී ගැනීමේ දී තෝරා ගැනීමට ගනුදෙනුකරුවන් ඉතා සුළු ප්‍රයත්නයක් දරයි. ඒ අනුව මෙම භාණ්ඩ මිලදී ගැනීමේ දී පාරිභෙබ්ගිකයා වැයකරන වෙහෙස හා කැප කරන කාලය අඩුය. මෙසේ පහසු භණ්ඩ ලෙස පාරිභෝගිකයා විසින් තෝරාගනු ලබන්නේ වටිනාකමින් අඩු නිෂ්පාදිත වේ.

එබැවින් බොහෝ විට මෙම භාබ්ඩ අඩු මිලක් සහිත ඒවා වේ. එසේම පාරිභෝගිකයකින් නිරත්තරයෙන් මිලට ගන්නා භාණ්ඩ ද මෙම ගණයට බොහෝ විට අයත් වෙව් එම නිෂ්පාදිත පිළිබඳව පාරිභෝගිකයා තුළ ගොඩනැගුනු විශ්වාසය හා ධනාත්මක පාරිභෝගික වටිනාකම හේතුවෙන් අදාළ භාණ්ඩයේ සන්නම් නාමයෙන්ම ඉල්ලුම් කරනු දැකිය හැකිය.

නිදසුන්, ..........................................................................................................................

### සාප්පු භාණ්ඩ

මිල හා ගුණාත්මය සසඳා තෝරාගන්නා භාණ්ඩ මේ නමින් හැඳින්වේ.

මෙම භාණ්ඩ මිල දී ගැනීමේ දී භාණ්ඩ තෝරා ගැනීම සඳහා පාරිභෝගිකයා විසින් යම් ප්‍රමාණයක ප්‍රයත්නයක් හා කාලයක් වැය කරනු ලබන අතර ගෙවන මිලට උපරිම තෘප්තියක් ලබා ගැනීම සඳහා විමසිල්ලෙන් මිලදී ගනී.

නිදසුන්, ...........................................................................................................................

### සාප්පු භාණ්ඩ සැසඳීම

සාමාන්‍යයෙන් සාප්පු භාණ්ඩ දෙයාකාරයකින් සැසඳීමට භාජනය වේ.

1. **මිල සැසඳීම**

   සෑම භාණ්ඩයක්ම එකම ගුණයෙන් හා ස්වරූපයෙන් යුක්තය යන උපකල්පනය මත භාණ්ඩයේ මිල පමණක් සැලකිල්ලට ගෙන මිල සැසඳීමෙන් පසු මිලදී ගැනීම තීරණය කරයි.

2. **ගුණත්වය සැසඳීම**

   මිලට වඩා භාණ්ඩයේ ගුණත්වය වැදගත් කොට සලකන විට ගුණය පමණක් සසඳා බලා මිලදී ගැනීම සිදු කරයි.

### විශේෂිත භාණ්ඩ

මිලදී ගැනීමේ දී පාරිභෝගිකයින් විශාල ප්‍රයත්නයක් නැතහොත් විශේෂිත ආයාසයක් දරනු ලබන භාණ්ඩ වේ.

විශාල ප්‍රයත්නයක් දරා පාරිභෝගිකයකු විසින් වෙළෙඳපොළ තුළින් මෙම භාණ්ඩ මිලදී ගන්නා අතර පාරිභෝගිකයා තෘප්තිමත් වන්නේ මෙම විශේෂිත භාණ්ඩය පරිභෝජනය කිරීමෙන්ම පමණි. මෙවැනි භාණ්ඩ මිලදී ගැනීමේ සීඝ්‍රතාවය ඉතාඅඩු වන අතර දිගු කලකට වරක් මිලදී ගනී. එසේම පාරිභෝගික දෘෂ්ටියෙන් බලන විට මෙවැනි භාණ්ඩ සඳහා ආදේශක නොමැත. එසේම මෙවැනි භාණ්ඩ බෙදාහරින / මිලදී ගත හැකි ස්ථාන සීමාසහිත වන අතර ඉතා කුඩා වෙළෙඳපොළ අවස්ථාවන් මෙම භාණ්ඩ සඳහා පවතින බැවින් බොහෝ විට එවැනි භාණ්ඩයක මිල ඉතා ඉහළ අගයක් ගනු ඇත.

නිදසුන්, ...........................................................................................................................

## නොසෙවූ භාණ්ඩ

විකිණීම සඳහා වෙළෙඳපොළේ තිබෙන නමුත් ඒ බව පාරිභෝගිකයා නොදන්නා නිසා හෝ දන්නා නමුත් මිලට ගැනීමට උනන්දු නොවන භාණ්ඩ වේ. එනම් මිලදී ගැනීම සඳහා පාරිභොගිකයා විසින් මදුල් වැය කිරීමට අදහස් නොකරන භාණ්ඩ වේ. බොහෝ විට අළුතින් වෙළෙඳපොළට ඉදිරිපත් කරන භාණ්ඩ වේ. බොහෝ විට අළුතින් වෙළෙඳපොළට ඉදිරිපත්කරන භාබ්ඩ පිළිබඳව ප්‍රචාරණය තුළින් පාරිභෙබ්ගිකයා දැනුවත් වන තෙක් ඒවා නොසෙවූ භාණ්ඩ ලෙස පවතී.

නිදසුන්, ........................................................................................................................

**කාර්මික භාණ්ඩ / ව්‍යාපාරික භාණ්ඩ - පාරිභෝගික භාණ්ඩ නිපදවීම සඳහා යොදාගනු ලබන භාණ්ඩ වේ. මේවා වර්ග 3 කි.**

1. ........................................................................................................................

   ව්‍යාපාරික කටයුතු වලදී ප්‍රයෝජනයට ගන්නා අමුද්‍රව්‍ය හා නිෂ්පාදන ද්‍රව්‍ය මේ යටතට ගැනේ.

   නිදසුන් : යකඩ, වානේ, ප්ලාස්ටික් ද්‍රව්‍ය සහ අමතර කොටස්


2. ........................................................................................................................

   පාරිභෝගික භාණ්ඩ නිෂ්පාදනයට හා නිෂ්පාදන කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය ස්ථාවර වත්කම් මීට අයත් වේ.

   නිදසුන් : යන්ත්‍ර, උපකරණ සහ සවිකිරීම්

3. ........................................................................................................................

   නිෂ්පාදනයට උපයෝගී කරගන්නා එහෙත් සාපේක්ෂව කෙටිකාලීන පැවැත්මක් ඇති භාණ්ඩ හා සේවා, සැපයුම් සේවා, ව්‍යාපාර සේවා ලෙස හඳුන්වයි. මේවාට අයත් දෑවලට නිදසුන් ලෙස පහත සටහන දැක්විය හැකිය.




පාරිභෝගික භාණ්ඩ හා කාර්මික භාණ්ඩ අතර ප්‍රධාන වෙනස්කම් කිහිපයක් හඳුනාගත හැකි අතර පහත වගුව මගින් එම වෙනස්කම් දක්වා ඇත.

## කාර්මික භාණ්ඩ හා පාරිභෝගික භාණ්ඩ අතර වෙනස්කම්

| පාරිභෝගික භාණ්ඩ | කාර්මික භාණ්ඩ |
|---|---|
| පාරිභෝගිකයන් විසින් අවසාන පරිභෝජනය සඳහා ඉල්ලුම් කරයි. | ව්‍යාපාරිකයින් විසින් වෙනත් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සඳහා ඉල්ලුම් කරයි. |
| පරිභෝජනයෙන් අවසන් වන භාණ්ඩ වේ. | පාරිභෝගික භාඬඩ නිපදවීමට යෙදාගන්නා භාණ්ඩ වේ. |
| සාපේක්ෂව විශාල ප්‍රමාණයක් නිෂ්පාදනය කෙරේ. | සාපේක්ෂව නිෂ්පාදන ප්‍රමාණය අඩුය. |
| බෙදාහැරීමේ දී යොදාගන්නා අතරමැදියන් සංඛ්‍යාව වැඩිය. | බෙදාහැරීමේ දී යොදාගන්නා අතරමැදියන් සංඛ්‍යාව වැඩිය. |
| ගැනුම්කරුවන් සංඛ්‍යාව සාපේක්ෂව විශාල වේ. | ගැනුම්කරුවන් සංඛ්‍යාව සාපේක්ෂව සීමිත වේ. |
| ඉල්ලුනු ලබන වාර ගණන සාපේක්ෂව වැඩිය. | ඉල්ලනු ලබන වාර ගණන සාපේක්ෂව අඩුය. |
| සෘජු ඉල්ලුමක් පවතී. | ව්‍යුත්පන්න ඉල්ලුමක් පවතී. |

## වෙළෙඳපොළ

නූතන වෙළෙඳපොළ යන්න සඳහා තේරුම් 03 ක් දිය හැකිය. විකිණීමට ඉදිරිපත් කිරීමක් හෙවත් විද්‍යුත් වෙළෙඳපොළක් / වෙළෙඳපොළ අවකාශයක් භාණ්ඩ හා සේවා විකුණන නිශ්චිත ස්ථානයක්, එක හා සමාන වුවමනා ඇති පුද්ගල කණ්ඩායමක්, වෙළෙඳපොළක් යන්නෙන් අදහස් වේ.

නූතන වෙළෙඳපොළ පහත පරිදි වර්ග කෙරේ.

**පාරිභෝගික වෙළෙඳපොළ**

පාරිභෝගික භාණ්ඩ හා සේවා අවසාන පරිභෝජනය උදෙසා අලෙවි කරන වෙළෙඳපොළ වේ.

**සේවා වෙළෙඳපොළ**

සේවා නිෂ්පාදිත එනම් මූල්‍ය සේවා, කාර්මික සේවා යනාදිය හුවමාරු වන වෙළෙඳපොළයි.

**ප්‍රාග්ධන භාණ්ඩ වෙළෙඳපොළ**

ව්‍යාපාර ආයතන විසින් භාවිත කරන යන්ත්‍ර, උපකරණ හා මෙවලම් යනාදිය හුවමාරු වන වෙළෙඳපොළයි.

**ශ්‍රම වෙළෙඳපොළ**

ශ්‍රමිකයන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන වෙළෙඳපොළයි.

**නිවාස සහ දේපළ වෙළෙඳපොළ**

නිවාස සහ දේපල මිලදී ගැනීම හා අලෙවි කිරීමට අදාල වෙළෙඳපොළයි.

**මුදල් වෙළෙඳපොළ**

කෙටිකාලීන අරමුදල් සපයා ගැනීම සඳහා මුදල් අතිරික්ත හා ඌන පාර්ශව සම්බන්ධ වන වෙළෙඳපොළයි.

**ප්‍රාග්ධන වෙළෙඳපොළ**

දිගුකාලීන අරමුදල් සපයා ගැනීම සඳහා මුදල් අතිරික්ත හා ඌන පාර්ශව සම්බන්ධ වන වෙළෙඳපොළයි.

**ද්‍රව්‍ය වෙළෙඳපොළ**

අමුද්‍රව්‍ය මිලදී ගැනීම හා විකිණීම හා සම්බන්ධ වෙළෙඳපොළයි.

**කාර්මික වෙළෙඳපොළ**

වෙනත් භාණ්ඩ හා සේවා නිපදවීම සදහා ව්‍යාපාරිකයින් විසින් භාණ්ඩ හා සේවා මිලදී ගන්නා වෙළෙඳපොළයි.

කාර්මාන්තය හා වෙළෙඳපොළ යන එකිනෙකට සමීප සංකල්ප දෙකක් වන අතර කර්මාන්තය යන්නෙන් අලෙවිකරුවන්ගේ එකතුවක් අදහස් වන අතර වෙළෙඳපොළ යන්නෙන් ගැනුම්කරුවන්ගේ එකතුවක් අදහස් වෙව් කර්මාන්තය හා වෙළෙඳපොළ අතර අන්තර් සම්බන්ධය පහත පරිදි ඉදිරිපත් කළ හැකිය.




## ව්‍යාපාර වල අනාගත අපේක්ෂා

ව්‍යාපාර විසින් සිය ක්‍රියාකාරීත්වය තුළ ළඟාකර ගැනීමට බලාපොරොත්තු වන තත්ත්ව, අනාගත අපේක්ෂා යන්නෙන් අදහස් වේ. මෙම අනාගත අපේක්ෂා ව්‍යාපාර විසින් ඉදිරිපත් කරනු ලබන ස්වරූප කිහිපයක් දැකිය හැකිය.

1. ..............................................................................................................................
2. ..............................................................................................................................
3. ..............................................................................................................................
4. ..............................................................................................................................

දැක්ම යනු තම ව්‍යාපාරය පිළිබඳව එහි ප්‍රවර්ථකයා තුළ ඇතිවන සිහිනයයි. එය ව්‍යාපාරයට මගපෙන්වන විචිත්‍රවත් අනාගතයක් පිළිබඳව වන බලාපොරොත්තුවකි. දැක්ම යන්න ව්‍යාපාරයක ගමනාන්තය නොවන අතර එය ව්‍යාපායට මග පෙන්වන සුවිශේෂී බලාපොරොත්තුවක් වේ.

ජේම්ස් සී කොලින්ස් සහ ජෙරී අයි පොරාස් ට අනුව දැක්ම යන්න මූලික සාධක දෙකකින් සමන්විත වේ.

1. ..............................................................................................................................
2. ..............................................................................................................................


සක්‍යා SAKYA ACADEMY OF HIGHER EDUCATION

හර සංකල්පය මගින් වයාපාරයේ දිගුකාලීන අනන්‍යතාව, එනම්, ආයතනයේ නොවෙනස්ව පවත්නා ගන්නා නිත්‍ය ලක්ෂණ අර්ථ දක්වන අතර එය හර අගනාවන් සහ හර අභිමතාර්ථයන්ගෙන් සමන්විත වේ. පරිකල්පිත අනාගතය යනු ව්‍යාපාරයේ අනාගතය පිළිබඳව වන දිගුකාලීන අරමුණු හා විචිත්‍රවත් අනාගතය පිළිබඳව වන බලාපොරොත්තුව යි.

නිෂ්ටාව හෙවත් මෙහෙවර යනු ආයතනය ඒ හා සමාන අනෙකුත් ආයතන වලින් වෙනස් වන ආකාර පැහැදිලි කරනු ලබන ප්‍රකාශයයි. ඒ මගින් ආයතනය බිහිකිරීමේ හේතුව පැහැදිලි කරන අතර මෙය අනාගත ළඟා කරගැනීම් සඳහා වන වර්තමාන සූදානම පිළිබඳව පැහැදිලි කරයි. එසේම, ආයතනයේ දැක්ම තවදුරටත් විස්තර කිරීමක් මෙමගින් සිදු කරයි.

එසේම දැක්ම හා නිෂ්ඨාව ලඟාකර ගැනීම වෙනුවෙන් ව්‍යාපාර විසින් අරමුණු හා පාරමාර්ථ පිහිටුවා ගනු ලබන අතර එසේ පිහිටුවාගනු ලබන මෙහෙයුම් නොවන ගුණාත්මක ලඟාකරගැනීම් අරමුණු පරමාර්ථ දිගු කාලීන වේ. පරමාර්ථ යනු දිග- කාලීනව ඉටු කරගැනීමට ආයතනයක් ගොඩ නගා ගන්නා අභිප්‍රායක් වේ. මේවා මත කෙටි කාලීනව ගොඩ නගා ගන්නා අභිප්‍රායන් හෙවත් අරමුණු පවත්වා ගනී. අරමුණු SMART විය යුතුය.

| | |
|---|---|
| **S** | නිශ්චිත බව / සුවිශේෂී බව |
| **M** | මැනිය හැකි බව |
| **A** | ළඟා කරගත හැකි බව හෝ සෑම දෙනාම එකඟ විය යුතු බව |
| **R** | යථාර්ථවාදී බව / තාත්වික බව |
| **T** | කාල රාමුවක් තිබීම / කාල සීමාවක් දැක්වීම |

## උපායමාර්ග

තරඟකාරීත්වය තුළින් වාසි සහගත තත්ත්ව ඇතිකරගැනීම සඳහා ව්‍යාපාරයක් විසින් තෝරාගනු ලබන සුවිශේෂී වූ ක්‍රමවේදය මින් අදහස් වේ. උපාය මාර්ගයක් සැමවිටම තරඟ කාරීත්ව වාසි පිළිබඳව අවධානය යොමු කරනු අතර ව්‍යාපාරයක් සතු හර නිපුණතා හා අද්විතීය සම්පත් ප්‍රමාණය මත උපායමාර්ගික හැකියා තීරණය වේ.

ඉහත සඳහන් කල අරමුණු හා පරමාර්ථ මෙන්ම උපායමාර්ග ද භාවිත කරන කළමනාකරුවන්ගේ ධූරාවලිය අනුව කොටස් 03 ක් යටතේ වර්ගීකරණය කළ හැකිය.

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

උපායශීලී ව්‍යාපාර ඒකක සඳහා සකස් කෙරෙන උපායමාර්ග මින් අදහස් වේ. නිෂ්පාදිත අනුව දෙපාර්තමේන්තු ගත කළ ව්‍යාපාරයක ඒ ඒ නිෂ්පාදිත වෙළෙඳාමට අදාළව මෙන්ම ව්‍යාපාර ඒකක වලට වෙන්කල හැකි සමූහ ව්‍යාපාරයක ඒ ඒ ව්‍යාපාර ඒකකය වෙනුවෙන් වෙන් වෙන්ව සකස් කරන උපාය, ව්‍යාපාර මට්ටමේ උපාය මාර්ග ලෙසත් හැඳින්වේ.

.............................................................................................................................................

එක් එක් ව්‍යාපාරික ශ්‍රිතයන් වෙනුවෙන් ශ්‍රිතමය කළමනාකරුවන් විසින් සකස් කරනු ලබන උපායමාර්ග මින් අදහස් වේ. මෙම උපායමාර්ග පළමු පෙල කළමනාකරුවන්ගේ කාර්යයන් සම්බන්ධ උපාය මාර්ගයන්ය. වැඩ සේවකයන්ගෙන් කාර්යයන් ඉටු කර ගැනීම සඳහා මෙම උපාය මාර්ග බහුලව භාවිතා කෙරේ.

පරිච්ඡේදය **02**

# ව්‍යාපාර සංවිධාන හැඳින්වීම

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

**ව්‍යාපාර සංවිධාන හා සම්බන්ධ විවිධ සංකල්ප**

**1. සංස්ථාපිත ව්‍යාපාර සහ සංස්ථාපිත නොවන ව්‍යාපාර**

කිසියම් සුවිශේෂී නීතියක් පදනම් කරගෙන බිහිවී ඇති ව්‍යාපාර සංස්ථාපිත ව්‍යාපාර වන අතර එසේ නීතිමය පදනමකින් තොරව බිහිකල හැකි ව්‍යාපාර සංස්ථාපිත නොවන ව්‍යාපාර ලෙස හැඳින්වේ.

2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ බිහිකරන සමාගම්, 1972 අංක 05 දරණ සමූපකාර පනත යටතේ බිහිකරන සමූපකාර සමිති සහ පොදු හා විශේෂිත නීති මගින් රජය විසින් කලින් කලට ඇතිකරනු ලබන රාජ්‍ය සංස්ථාවන් ද සංස්ථාපිත ව්‍යාපාර ලෙස හඳුනාගන්නා අතර එසේ නීතිමය පදනමකින් තොරව බිහිකල හැකි කේවල ස්වාමි ව්‍යාපාර, හවුල් ව්‍යාපාර යනාදිය සංස්ථාපිත නොවන ව්‍යාපාර වේ.

**ලියාපදිංචිය හා සංස්ථාපනය**

**ලියාපදිංචිය**

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

නිදසුන් ලෙස කේවල ස්වාමි ව්‍යාපාර, හවුල් ව්‍යාපාර, ව්‍යාපාර නාම ප්‍රඥප්තිය යටතේ ව්‍යාපාරය අයත් පළාත් සභාවේ ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කිරීම දැක්විය හැකිය.

**සංස්ථාපනය**

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

ඒ සඳහා කිසියම් නීතියක දක්වා ඇති ක්‍රියාපටිපාටියට අනුකූලව ව්‍යාපාරය බිහිකිරීම කළ යුතුවේ. නිදසුන් ලෙස සීමිත සමාගම් 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ සංස්ථාපනය කිරීම හා සමූපකාර සමිති 1972 අංක 05 දරණ සමූපකාර පනත යටතේ සංස්ථාපනය කිරීම දැක්විය හැකිය.

සංස්ථාපිත ව්‍යාපාරයක සහ සංස්ථාපිත නොවූ ව්‍යාපාරයට පවතින මූලික වෙනස්කම්

| **සංස්ථාපිත ව්‍යාපාර** | **සංස්ථාපිත නොවූ ව්‍යාපාර** |
|---|---|
| නීතිමය පුද්ගලභාවයක් පවතී. එනම් නීතිය ඉදිරියේ දී ව්‍යාපාර නාමය පුද්ගලයෙකු ලෙස සලකයි. | නීතිමය පුද්ගලභාවයක් නොපවතී. එනම් නීතිය ඉදිරියේ දී ව්‍යාපාර නමාය පුද්ගලයෙකු ලෙස නොසළකයි. |
| නීතිමය ප්‍රතිපාදන අනුව කටයුතු කිරීම අනිවාර්යය වේ. | නීතිමය ප්‍රතිපාදන අනුව කටයුතු කිරීම අනිවාර්යය නොවේ. |
| ලියාපදිංචිය සඳහා විශේෂිත අණපනත් බලපායි | ලියාපදිංචිය සම්බන්ධයෙන් බලපාන්නේ පොදු නීතියයි. |
| ගිණුම් තැබීම හා විගණනය අනිවාර්ය වේ. | ගිණුම් තැබීම හා විගණනය අනිවාර්ය නොවේ. |
| වගකීම් බොහෝ විට සීමා සහිත වේ. | වගකිම බොහෝ විට සීමා රහිත වේ. |

2. ..............................................................................................................................

ව්‍යාපාරයකට සිය නමින් නීතිමය කටයුතු කිරීමට ඇති හැකියාව එනම් ව්‍යාපාරයක් එහි අයිතිකරුගෙන් වෙන් වූ වෙනමම ඒකකයක් ලෙස නීතිය ඉදිරියේ පිළිගන්නා බව නීතිමය පුද්ගලභාවය යන්නෙන් අදහස් වේ. නීතිමය පුද්ගලභාවයක් හිමි වීමට නම් ව්‍යාපාරයක් සංස්ථාපිත ව්‍යාපාරයක් වීම අත්‍යාවශ්‍ය වේ. එවැනි නීතිමය අනන්‍යතාවයක් ඇති ව්‍යාපාරයකට සිය ව්‍යාපාය නමින් නඩු පැවරීමටත්, වෙනත් පාර්ශ්වයන්ට ව්‍යාපාරය නමින් නඩු පවරනු ලැබීමටත්, ව්‍යාපාරය නමින් ගිවිසුම් වලට එළඹීමටත්, ව්‍යාපාරය නමින් බදු ගෙවීමටත් හැකියාව ලැබේ.

3. ..............................................................................................................................

ව්‍යාපාරයේ ණය හා වෙනත් බැඳීම් සම්බන්ධයෙන් එහි හිමිකරුවන් වෙත ඇති බැඳීම වගකීමයි. වගකීම සීමිත වගකීම හා අසීමිත වගකීම යනුවෙන් කොටස් 02 කි. වගකීම් පියවීම යෙදූ ප්‍රාග්ධනයට පමණක් සීමා වන තත්ත්වයක් සීමිත වගකීම යන්නෙන් අදහස් වන අතර යෙදූ ප්‍රාග්ධනයට අමතරව තම පෞද්ගලික දේපල වලින් ද බාහිර වගකීම් පියවීමට සිදුවන තත්ත්වයක් අසීමිත වගකීම යන්නෙන් අදහස් කෙරේ.

4. ..............................................................................................................................

හිමිකරුගේ මිය යාම හෝ ඉවත් වීම, බුන්වත් වීම, සිහිවිකල වීම සිදු වුවද බාධාවකින් තොරව ව්‍යාපාරයේ පැවැත්ම අඛණ්ඩව සිදු වන බවයි. සංස්ථාපිත ආයතන වන සමාගම්, සමූපකාර සම්බන්ධයෙන් අඛණ්ඩ පැවැත්මක් පවතී. කේවල ස්වාමි ව්‍යාපාර, හවුල් වයාපාර, බද්ද ව්‍යාපාර සම්බන්ධයෙන් අඛණ්ඩ පැවැත්මක් නොපවතී.

## 5. හිමිකාරීත්වය

හිමිකාරීත්වය මත ව්‍යාපාර සංවිධාන ප්‍රධාන වශයෙන් පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධාන සහ පොදු අංශයේ ව්‍යාපාර සංවිධාන ලෙස කොටස් දෙකකට බෙදනු ලබයි. අයිතිය තනි පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමකට පමණක් සීමා වන ව්‍යාපාර සංවිධාන විශේෂය පෞද්ගලික අංශය සතු ව්‍යාපාර ලෙස හැඳන්වේ. බොහෝ විට මේවා ලාභ අරමුණ උදෙසා පවත්වා ගනී. කේවල ස්වාමි ව්‍යාපාර, හවුල් ව්‍යාපාර, සීමිත සමාගම් පෞද්ගලික අංශය මේ සඳහා උදාහරණ වේ.


අයිතිය රජය, පළාත් සභා සහ පළාත් පාළන ආයතන සතු වන ව්‍යාපාර නැතහොත් රාජ්‍ය මූල්‍ය සම්පත් යොදවා ඇති ව්‍යාපාර පොදු අංශය සතු ව්‍යාපාර වේ. නිදසුන් ලෙස රාජ්‍ය සංස්ථා, රාජ්‍ය දෙපාර්තමේන්තු, රාජ්‍ය සමාගම්, පළාත් පාලන අධිකාරීන් යනාදිය දැක්විය හැකිය.

# විවිධ ව්‍යාපාර සංවිධාන වර්ග

ලොව පුරා පවතින ව්‍යාපාර විවිධ අයුරින් සංවිධානය වී ඇති බව පෙනේ. ඒවායින් කිහිපයක් පහත පරිදි වේ.

1. කේවල ස්වාමි ව්‍යාපාර
2. හවුල් ව්‍යාපාර
3. බද්ධ ව්‍යාපාර
4. සංස්ථාපිත සමාගම්
5. සමූපකාර
6. වරලත් ව්‍යාපාර
7. රාජ්‍ය දෙපාර්තමේන්තු
8. රාජ්‍ය සංස්ථා
9. රාජ්‍ය සමාගම්

ඉහත සඳහන් ව්‍යාපාර සංවිධාන විවිධ අයුරින් වර්ග කිරීම්වලට ලක්ව ඇත. එම විවිධ වර්ගීකරණයන් පහත දැක්වෙන ගැනීම් සටහන මගින් දැක්විය හැකිය.




## තනි පුද්ගල ව්‍යාපාරයකට බලපාන පොදු නීති

1. ........................................................................................................................................

ව්‍යාපාරයේ නාමය අයිතිකරුගේ නමින් හැර ව්‍යාජ නාමයකින් පවත්වාගෙන යන්නේ නම් 1918 ව්‍යාපාර නාම ආඥා පනත පදනම් කරගෙන ව්‍යාපාරය අයත් පළාත් සභාවේ ව්‍යාපාර නාම ප්‍රඥප්තියට අනුව ලියාපදිංචි කළ යුතුය.

2. **විශේෂ බලපත්‍ර ලබා ගැනීමට අදාළ නීති**

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

3. **ව්‍යාපාර කරගෙන යාමේ දී බලපාන අතුරු නීති**

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

### 4. සේවකයින් සම්බන්ධ නීති / කම්කරු නීති

සාප්පු හා කාර්යාල සේවක පනත, සේවක අර්ථසාධක අරමුදල් පනත, පාරිතෝෂික ගෙවීම් පනත, වෘත්තීය සමිති ආඥා පනත, කාර්මික ආරවුල් පනත, 1954 සාප්පු හා කාර්යාල සේවක පනත යනාදී නීති අදාළ වේ.

### 5. ව්‍යාපාර ආරම්භ කරන ප්‍රදේශයේ විශේෂ අවසර ලබා ගැනීම්

නාගරික සංවර්ධන අධිකාරිය, නගර සභා, ප්‍රාදේශීය සභා

### 6. ව්‍යාපාර සඳහා බලපාන වෙනත් වශේෂ නීති

පරිසර ආරක්ෂණ බලපත්‍ර (මධ්‍යම පරිසර අධිකාරිය)

**කේවල ස්වාමි ව්‍යාපාරයක ලක්ෂණ පහත පරිදි සාරාංශ ගත කළ හැකිය.**

| | |
|---|---|
| අයිතිය | තනි පුද්ගලයකු සතුය |
| ප්‍රාග්ධනය | අයිතිකරු විසින් තනිව සපයයි |
| පරිපාලනය හා තීරණ ගැනීම | අයිතිකරු විසින් හෝ ඔහුගේ අධීක්ෂණය යටතේ පරිපාලනය සිදු වේ. එම නිසා ව්‍යාපාරික තීරණ ගනු ලබන්නේ ව්‍යාපාරිකයා විසින් ම ය. |
| වගකීම | අසීමිත වගකීමක් දක්නට ලැබේ. එනම් බාහිර ණය ගෙවීම සඳහා සිය පෞද්ගලික දේපල පවා කැප කිරීමට සිදු වේ. |
| නීතිමය පුද්ගල භාවය | නීතිමය පුද්ගලභාවයක් හිමිනොවේ. නීතිය ඉදිරියේ ව්‍යාපාරය නමින් කටයුතු කළ නොහැක. එනම් ව්‍යාපාරිකයාගේ පෞද්ගලික නමින් පමණක් කටයුතු කළ හැකිය. |
| ලියාපදිංචිය | අනිවාර්යය නැත. අයිතිකරුගේ නමින් හැර වෙනත් කටයුත්තක් පවත්වාගෙන යනු ලබන්නේ නම් 1918 අංක 06 දරණ ව්‍යාපාර නාම ආඥා පනත පදනම් කොට ගෙන අදාළ ව්‍යාපාරය අයත් පළාත් සභාවේ ව්‍යාපාර නාම ප්‍රඥප්තිය අනුව පළාත් සභාවේ ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කළ යුතුය. |
| ලාභ අලාභ | තනිව භුක්ති විඳියි |
| බදු ගෙවීම | ව්‍යාපාරිකයාගේ නමින් එනම් පෞද්ගලිකව බදු ගෙවිය යුතුය. ව්‍යාපාරයේ නමින් බදු ගෙවීම කළ නොහැක. |
| ගිණුම් තැබීම හා විගණනය | අත්‍යාවශ්‍ය නොවේ. අරමුදල් කාර්යක්ෂමව භාවිත කිරීම සඳහා පවත්වා ගත හැකිය. |
| අඛණ්ඩ පැවැත්ම | අඛණ්ඩ පැවැත්මක් නැත. |

## කේවල ස්වාමි ව්‍යාපාර ක්‍රමයේ වාසි / හිතකර ලක්ෂණ

1. ..........................................................................................................
2. ..........................................................................................................
3. ..........................................................................................................
4. ..........................................................................................................
5. ..........................................................................................................
6. ..........................................................................................................
7. ..........................................................................................................
8. ..........................................................................................................
9. ..........................................................................................................
10. ..........................................................................................................

## කේවල ස්වාමි ව්‍යාපාර ක්‍රමයේ අවාසි / අහිතකර ලක්ෂණ

1. ..........................................................................................................

   ව්‍යාපාරය තුළින් පැන නගින් සියලුම ණය සඳහා අයිතිකරු පෞද්ගලිකව අසීමිතව වගකිමට බැඳෙන අතර ව්‍යාපාරයේ යෙදවූ ප්‍රාග්ධනයට වඩා ණය ප්‍රමාණය වැඩි වුවහොත් එය පියවීමට අයිතිකරුගේ පෞද්ගලික දේපළ පවා කැප කළ යුතුය.

2. ..........................................................................................................

   කේවල ස්වාමි ව්‍යාපාර ක්‍රමයේ අසීමිත වගකීම නිසා ඉහළ අවදානමක් පවත්නා බැවින් බැංකු වැනි මූල්‍ය ආයතන මෙන්ම පුද්ගලික ණය සැපයුම්කරුවන් ද ණය ලබා දීමට ඉහළ ඇප සුරැකුම් ඉල්ලා සිටී. එබැවින් බාහිර පාර්ශ්වයන්ගෙන් වැඩි ප්‍රාග්ධනයක් රැස් කරගැනීම දුෂ්කර වන අතර බොහෝ විට වයාපාරයට අවශ්‍ය සියලු අරමුදල් අයිතිකරුටම යෙදීමට සිදු වේ

3. ..........................................................................................................

   තනි ව්‍යාපාරයේ සාර්ථක අසාර්ථකභාවය බොහෝ දුරට අයිතිකරු මත තීරණය වේ. අයිතිකරු සෑම විටම ව්‍යාපාරයේ සියළු අංශ පිළිබඳ දක්ෂණතා සහ කුසලතාවලින් යුත්ක නොවේ. ව්‍යාපාර පරිචය පිළිබඳ අයිතිකරුවන්ගේ පවතින දැනුම මඳකම ව්‍යාපාරයේ අසාර්ථකත්වයට හේතු විය හැකිය.

4. ..........................................................................................................

   ව්‍යාපාරයේ රඳා පැවැත්ම දැඩි ලෙසම අයිතිකරුගේ හැකියාව මත තීරණය වන අතර කේවල ස්වාමි වයාපාරයක පැවැත්ම අවිනිශ්චිත වේ. අයිතිකරුගේ උනන්දුව අඩු වීම, සෞඛ්‍ය දුර්වල වීම හෝ මිය යාම වැනි හේතු නිසා ව්‍යාපාරය වැසී යා හැකිය.

**5. අලාභ අයිතිකරු තනිව විඳදරාගත යුතු වීම**

සියලුම අලාභවලට අයිතිකරු සෘජුවම වගකිව යුතු වේ.

**6. නීතිමය පුද්ගලභාවයක් නොමැති වීම**

නීතිමය දෘෂ්ටියෙන් ව්‍යාපාරයත් අයිතිකරුත් එකක් වේ. එනම් අයිතිකරුගෙන් වෙන් වූ නීතිමය තත්ත්වයක් ව්‍යාපාරයට නොමැත.

**7. දක්ෂ සේවකයින් ආකර්ෂණය කර ගැනීම දුෂ්කර වීම**

අඛණ්ඩ පැවැත්මක් නොමැති වීමත් සේවකයින්ට වැඩි වැටුප් හා වේතන ගෙවීමේ හැකියාවක් නොමැති වීමත් නිසා සුදුසුකම් සහිත දක්‍ෂ සේවකයින් බඳවා ගැනීම අපහසු වේ.

**8. ව්‍යාපාරය පුළුල් වන විට කළමනාකරණය අපහසු වීම**

ව්‍යාපාරය පුළුල් වන විට එනම්, සේවක සංඛ්‍යාව, නිෂ්පාදන ධාරිතාව වැනි සාධක වර්ධනය වන විට අයිතිකරුට තනිව ව්‍යාපාරය පාලනය කිරීමට අපහසු විය හැකිය. ඒ සඳහා අවශ්‍ය දැනුම ප්‍රමාණවත් නොවිය හැකිය.

# හවුල් ව්‍යාපාර

1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ (1) වගන්තිය අනුව හවුල් ව්‍යාපාරයක් යන්න පහත පරිදි අර්ථ දක්වා ඇත.

ලාභ ලැබීමේ පරමාර්ථය මත පොදුවේ වයාපාර කටයුත්තක් පවත්වාගෙන යන පුද්ගලයින් අතර වූ සම්බන්ධතාවයකි.

## හවුල් ව්‍යාපාරයක් ඇතිවීමට අනිවාර්යයයෙන්ම තිබිය යුතු ලක්‍ෂණ

හවුල් ව්‍යාපාරයක් පැවතීමට අනිවාර්යෙන්ම පැවතිය යුතු කොන්දේසි 05 කි.

01. ..........

පුද්ගලයින් දෙදෙනෙකු හෝ වැඩි දෙනෙකු සම්බන්ධ වී සිටීම මින් අදහස් වෙච් හවුල්කරුවන් අවම වශයෙන් දෙදෙනෙකු (02) සිටිය යුතු අතර උපරිමය විසි දෙනෙකුට (20) කට සීමා වේ.

හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන්ගේ උපරිම සංඛ්‍යාව

හවුල් ව්‍යාපායක හවුල්කරුවන්ගේ උපරිම සංඛ්‍යාව 20 කට සීමා විය යුතුය යන්න 2007 අංක 07 දරණ සමාගම් පනතේ 519 (1) වගන්තිය මගින් දක්වා ඇත.

එහෙත් පහත සඳහන් වෘත්තීය ක්ෂේත්‍රයේ හවුල් ව්‍යාපාර සඳහා උපරිම හවුල්කරුවන් සංඛ්‍යාව සීමා කර නොමැත.

1. නීතීඥයින්ගේ හවුල් ව්‍යාපාර
2. ගණකාධිකාරීවරුන්ගේ (විගණක) හවුල් ව්‍යාපාර
3. කොටස් තැරැව්කරුවන්ගේ හවුල් ව්‍යාපාර
4. වෙනත් වෘත්තීය ක්ෂේත්‍රයන්හි හවුල් ව්‍යාපාර

02. ..........

හවුල් ව්‍යාපාරයක් ස්ථාපිත කිරීමට නම් හවුල්කරුවන් යම් ව්‍යාපාරයක් පවත්වාගෙන යාමට එකඟ විය යුතුය. වෙළෙඳාමක්, රැකියාවක් හෝ වෘත්තීයමය කටයුත්තක් වැනි ව්‍යාපාරික මුහුණුවරක් ගත් කාර්යයක හවුල් ව්‍යාපාරය නියුක්ත විය යුතු බව මින් අදහස් කෙරේ.

03. ..........

වාචික, ලිඛිත හෝ ව්‍යංග යන කවර ආකාරයක හෝ ගිවිසුමක් මත හවුල් ව්‍යාපාරය ඇති විය යුතු බව මින් අදහස් කෙරේ. ඒ අනව හවුල් ව්‍යාපාරය ඇති වනුයේ හවුල්කරුවන් අතර ඇති කරගන්නා ගිවිසුම මතයි. කුමන ආකාරයක හෝ ගිවිසුමක් නොමැති නම් හවුල් ව්‍යාපාරයක් පැවතිය නොහැක.

04. ..........................................................................................................................................................

හවුල්කරුවන් අතර ලාභ බෙදා ගැනීමේ පදනම මත හවුල් ව්‍යාපාරයක් නිර්මාණය වේ. හවුල් ව්‍යාපාරයක් පැවතීමට නම් අනිවාර්යයෙන්ම ලාභ ලැබීමේ අරමුණක් පැවතිය යුතුය.

05. ..........................................................................................................................................................

සෑම හවුල්කරුවකුම තමාගේ හා සෙසු හවුල්කරුවන්ගේ නියෝජිතයෙකු හා ප්‍රධානියෙකු වන බව මින් ප්‍රකාශ වේ. මේ නිසා එක් හවුල්කරුවකු කරනු ලබන කටයුතු සම්බන්ධයෙන් අනෙක් හවුල්කරුවන්ද වගකීමට බැඳේ. මේ අනුව සියලුම හවුල්කරුවන් ඔවුනොවුන් වෙනුවෙන් වගකීමට බැඳේ.

**හවුල් ව්‍යාපාරයක මූලික ලක්ෂණ**

| | |
|---|---|
| අයිතිය | හවුල්කරුවන් 02ත් 20ත් අතර සංඛ්‍යාවකට සීමා වීම. එහෙත් වෘත්තීය හවුල් සඳහා උපරිමය සීමාවක් නොමැත. |
| ප්‍රාග්ධනය සැපයීම | හවුල්කරුවන් ගිවිසගත් පරිදි ප්‍රාග්ධනයට දායක වීම. |
| වගකීම | හවුල්කරුවන්ගේ වගකීම අසීමිත වීම |
| කළමනාකරණය | සියළු හවුල්කරුවන් විසින් හෝ කිහිප දෙනෙකු විසින් කළමනාකරණ කටයුතු සිදු කරයි. |
| ලාභාලාභ බෙදා ගැනීම | හවුල්කරුවන් ගිවිසාගත් පරිදි ලාභාලාභ භුක්ති විඳී. |
| පාලනය | හවුල්කරුවන්ගේ සාමුහික පාලනය හා ගිවිසුමට හා හවුල් ආඥාපනතට අනුව පාලනය සිදු වේ. |
| පැවැත්ම | අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම. |
| නීතිමය පුද්ගලභාවය | නීතිමය පුද්ගලභාවයක් නොමැති අතර නීතිය ඉදිරියේ හවුල්කරුවන්ගේ නමින් පෙනී සිටිය යුතුය. |
| ලියාපදිංචිය | සියළු හවුල්කරුවන්ගේ නම් වලින් පවත්වාගෙන යන්නේ නම් ලියාපදිංචිය අනිවාර්ය නොවේ. |
| ගිණුම් තැබීම හා විගණනය | ගිණුම් තැබීම හා විගණනය අනිවාර්ය නොවේ. |
| විසුරුවා හැරීම | අධිකරණය මඟින් හෝ ස්වේච්ඡාවෙන් විසුරුවා හැරීම සිදුවේ. |
| බදු ගෙවීම | ව්‍යාපාරය නමින් ආදායම් බදු ගෙවිය නොහැකි අතර හවුල්කරුවන් තනි තනිව බදු ගෙවීම කළ යුතු වේ. |

## හවුල් ව්‍යාපාර කෙරෙහි බලපාන විශේෂ අණපනත්

01. 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

02. 1840 අංක 07 දරණ වංචා වැළැක්වීමේ ආඥා පනත

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

03. 2007 අංක 07 දරණ සමාගම් පනත

.............................................................................................................................................

04. 1918 අංක 06 දරණ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ආඥා පනත

හවුල්කරුවන්ගේ නම් වලින් හැර වෙනත් නමකින් ව්‍යාපාරය පවත්වාගෙනයනු ලබයි නම් එකී නාමය ලියාපදිංචි කළ යුතු බව (පනතේ 02 (1) වගන්තිය)

05. 1907 සීමාසහිත හවුල් ව්‍යාපාර ආඥා පනත

සීමිත හවුලක් සම්බන්ධ විස්තර දැක්වේ.

## හවුල් ව්‍යාපාරයක් / හවුල් ගිවිසුමක් ඇති විය හැකි ආකාර

**1.** **.............................................................................................................................**

හවුල්කරුවන්ගේ හැසිරීම් හා ක්‍රියාකාරීත්වය මගින් ව්‍යාපාරය පිළිබඳ එකඟතාවය ඇතිවීම.

**2.** **.............................................................................................................................**

හවුල් ව්‍යාපාරය ඇරඹීමට හා පවත්වාගෙන යාමට අදාළ එකඟතාව කටවචනයෙන් ඇති වීම

**3.** **.............................................................................................................................**

හවුල් ව්‍යාපාරයකට අදාළ කොන්දේසි ලිඛිතව දක්වා ඊට අත්සන් කර එකඟත්වය ප්‍රකාශ කිරීම.

## හවුල් ගිවිසුම

හවුල් ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වාගෙන යාමට අදාළව හවුල්කරුවන් අතර ඇතිවන ව්‍යංග, වාචික හෝ ලිඛිත එකඟත්වය හවුල් ගිවිසුමයි.

හවුල් ව්‍යාපාරයක පැවැත්ම රඳා පවතින්නේ ගිවිසුම මතයි. වඩා යෝග්‍ය වන්නේ ගිවිසුම ලිඛිතව පැවතීමත් හා ඊට සියළු හවුල්කරුවන් එකඟත්වය ප්‍රකාශකර අත්සන් කර තිබීමත් ය. එසේ නොවුණහොත් හවුල් වයාපාරයේ ජීව කාලය කෙටි විය හැකිය.

## හවුල් ඔප්පුව / ව්‍යවස්ථාවලිය

හවුල්කරුවන් අතර ඇතිකරගන්නා කොන්දේසි අඩංගු ලිඛිත ගිවිසුමයි. එනම්, ව්‍යාපාරය කටයුතු පවත්වාගෙන යාම සම්බන්ධයෙන් හවුල්කරුවන් අතර ඇති කරනගන්නා කොන්දේසි අඩංගු නීත්‍යානුකූළ ලියවිල්ලයි.

ඒ අනුව හවුල් ගිවිසුම ලිඛිතව හා අත්සන් සහිත වූ විට එය හවුල් ඔප්පුව නැතහොත් හවුල් ව්‍යවස්ථාවලිය බවට පත් වේ. මෙය සමාගමක සාංගමික ව්‍යවස්ථාවලිය මෙන් ප්‍රසිද්ධියට පත් කරන ලියවිල්ලක් නොවේ. හවුල් ඔප්පුවක, හවුල් ව්‍යාපාරයකට අවශ්‍ය කොන්දේසි විස්තර සහිතව සඳහන් කළ හැකිය.

## හවුල් ව්‍යාපාරයක් සඳහා හවුල් ඔප්පුවක් ඇතිකර ගැනීමේ වාසි

1. හවුල් ඔප්පුවේ ඇති කොන්දේසි අනුව කටයුතු මැනවින් කළ හැකි වීම
2. මතභේද අඩුකරග හැකිවීම
3. ගැටළු පැන නැගුනු විට ඒවා ගිවිසුම් ප්‍රකාරව කටයුතු කරමින් විසඳාගත හැකිවීම
4. නීතිය ඉදිරියේ බලාත්මක කළ හැකිවීම.

## හවුල් ඔප්පුවක / හවුල් ගිවිසුමක ඇතුළත් කළ යුතු වැදගත් කරුණු හා කොන්දේසි

හවුල් ඔප්පුවක ඇතුලත් කළ යුතු මූලික කරුණු හා වැදගත් කොන්දේසි කිහිපයකි. එසේ ඇතුලත් කරන කරුණු අතර, හවුල් ව්‍යාපාරයේ නම සහ ලිපිනය, හවුල්කරුවන් ගේ නම් හා ලිපිනයන්, ව්‍යාපාරයේ ස්වභාවය, ව්‍යාපාරයේ අරමුණු, හවුල් ව්‍යාපාරයේ කාලසීමාව යනාදිය ඇතුළත් වෙවි එසේ ඇතුළත් කළ හැකි කොන්දේසි ලෙස, හවුල්කරුවන් ප්‍රාග්ධනයට දායක වන ආකාරය (මුදලින් / වත්කම් වලින් / කීර්තිනාමයෙන්), ලාභ අලාභ බෙදා ගන්නා ආකාරය, හවුල්කරුවන්ගේ අයිතිවාසිකම් හා යුතුකම්, හවුල්කරුවන් කළමනාකරණයට දායක වන ආකාරය, හවුල්කරුවන්ගේ අයිතිවාසිකම් හා යුතුකම්, හවුල්කරුවන් කළමනාකරණයට දායක වන ආකාරය, හවුල්කරුවන් අතර මතභේද නිරාකරණය කර ගන්නා ආකාරය, නව හවුල්කරුවන් බඳවාගැනීමෙ අවකාශය, සිටින හවුල්කරුවකු ඉවත්ව යාම, විශ්‍රාම ගැනීම හා හවුල්කරුවකුගේ මරණයේ දී කටයුතු කරන ආකාරය හා එහිදී කීර්තිනාමය ගණනය කරන ආකාරය, හවුල්කරුවකුට ගෙවීම් පිළිබඳව, හවුල්කරුවන්ගේ ගැනිලි පිළිබඳව හා ගැනිලි පොළී අයකරන ආකාරය, ප්‍රාග්ධනයට අමතරව ව්‍යාපාරයට ණය සැපයීම් හා ඒ සඳහා පොළී ගෙවීම් පිළිබඳව, ප්‍රාග්ධනයට පොළී ගෙවන ආකාරය, හවුල් ව්‍යාපාරය විසුරුවා හරින ආකාරය හා එහිදී වත්කම් බෙදා හැරීම පිළිබඳව, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ ගිණුම් වාර්තා පිළියෙල කිරීම පිළිබඳව යනාදී තොරතුරු දැක්විය හැකිය.

**සටහන**

හවුල් ඔප්පුව වලංගු වීමට නම් සියළු හවුල්කරුවන් ඊට අත්සන් කර නියමිත මුද්දර ගාස්තු ගෙවා නොතාරිස්වරයෙකු ලවා සහතික කළ යුතුය.

# හවුල්කරු

ලාභ ලැබීමේ චේතනාවෙන් තම වත්කම්, හැකියාවන් හෝ නාමය එක්තැන්කොට ඒ පිළිබඳව ඇතිවන වගකීම සාමූහිකව විඳ දරාගනිමින් හවුල් ව්‍යාපාරය පවත්වාගෙන යාමට එකඟ වන පුද්ගලයෙකු, හවුල්කරුවෙකු ලෙස හැඳින්වේ.

### හවුල්කරු සතු අයිතිවාසිකම් හා යුතුකම්

### හවුල්කරුවකු සතු අයිතිවාසිකම්

1. ..........................................................................................................................
2. ..........................................................................................................................
3. ..........................................................................................................................
4. ..........................................................................................................................
5. ව්‍යාපාරයට සපයන ණය අත්තිකාරම් සඳහා පොළී ලබා ගැනීම
6. යෙදූ ප්‍රාග්ධනයට පොළී ගෙවයි නම් එය ලබා ගැනීමේ අයිතිය
7. ව්‍යාපාරයේ දේපල එහි අභිවෘද්ධිය උදෙසා පරිහරණය
8. නව හවුල්කරුවන් බඳවා ගැනීම සම්බන්ධ තීරණ වලට සහභාගී වීම
9. හවුල් ව්‍යාපාරයෙන් ඉවත් වීම හෝ විශ්‍රාම යාම
10. ගැනිලි කිරීමට ඇති අයිතිය
11. හදිසි අවස්ථාවල ව්‍යාපාරය ආරක්ෂා කිරීම උදෙසා හදිසි තීරණ ගැනීමේ අයිතිය
12. තරඟකාරී නොවන වෙනත් ව්‍යාපාරවල යෙදීමේ අයිතිය

## හවුල්කරුවකු සහත යුතුකම්

1. ...........................................................................................................................
2. ...........................................................................................................................
3. ...........................................................................................................................
4. ...........................................................................................................................
5. ...........................................................................................................................
6. ...........................................................................................................................
7. ...........................................................................................................................
8. තම බලතල ඉක්මවා කටයුතු නොකිරීම
9. ගෙවීමක් නෙලබා හවුල් ව්‍යාපාරයේ කටයුතු කිරීම
10. ව්‍යාපාරය කෙරෙහි ඇති ඇල්ම වෙනත් කෙනෙකුට නොපැවරීම
11. ව්‍යාපාරයේ දේපල සිය පෞද්ගලික දේපල සේ සළකා පරිහරණය නොකිරීම

## හවුල්කරුවන් වර්ග

විවිධ අයිතිවාසිකම් සහිත හවුල්කරුවන්ට හවුල් ව්‍යාපාරයකට සහභාගී වීමේ අවකාශය හවුල් ව්‍යවස්ථාවලියෙන් සැලසිය හැකිය. ඒ අනුව හවුල්කරුවන් පහත පරිදි වර්ගකල හැකිය.

1. සාමාන්‍ය හවුල්කරු
2. ක්‍රියාකාරී හවුල්කරු
3. අක්‍රීය හෝ නිදන හවුල්කරු
4. සීමිත හවුල්කරු
5. නිහඬ හවුල්කරු
6. රහස්‍ය හවුල්කරු
7. ප්‍රමුඛ හවුල්කරු
8. ලාභ පමණක් ලබන හවුල්කරු
9. ආරූඪ හවුල්කරු
10. නාමමාත්‍ර හවුල්කරු

1. ................................................................................................................................

ප්‍රාග්ධනයට දායක වන කළමනාකරණ කටයුතු වල නියැලෙන, වගකීම අසීමිත, මහජනයා හවුල්කරුවකු බව දන්නා හා සියළු ව්‍යාපාරික වරප්‍රසාද භුක්ති විඳින හවුල්කරු, සාමාන්‍ය හවුල්කරු ලෙස හැඳින්වේ.

2. ................................................................................................................................

හවුල් ව්‍යාපාරයේ කළමනාකරණ කටයුතු සඳහා ක්‍රියාකාරීව සහභාගී වන වගකීම අසීමිත වන සාමාන්‍ය හවුල්කරුවකු වීම මින් අදහස් වේ. බොහෝ විට ලාභයට අමතරව වැටුපක් ද මොවුන් ලබයි.

3. ................................................................................................................................

ප්‍රාග්ධනය යොදා, ලාභයට හෝ පාඩුවට දායක වන, කළමනාකරණයට සහභාගී නොවන හවුල්කරුවකු බව මහජනයා නොදන්නා, වගකීම අසීමිත හවුල්කරු මින් අදහස් වේවි

4. ................................................................................................................................

වගකීම තමා යෙදූ ප්‍රාග්ධනයට සීමා වන සීමිත හවුල් ව්‍යාපාර වල සිටින හවුල්කරු සීමිත හවුල්කරු වේ. මොවුන් කළමනාකරණ කටයුතු වලට සහභාගී නොවන අතර මහජනයා ද නොදනී. යෙදූ ප්‍රාග්ධනය ගැනිලි ලෙස ඉවත්කර ගැනීමේ හිමිකමක් මොවුන්ට නොමැති අතරම අනෙක් හවුල්කරුවන් වෙනුවෙන් නියෝජ්‍යත්වයේ නියැලීමට ද නොහැක. සීමිත හවුල්කරුවකුගේ මිය යාම, බංකොලොත් වීම හවුල් වයාපාරයේ පැවැත්ම කෙරෙහි බලපෑම් නොකරයි.

5. ................................................................................................................................

ප්‍රාග්ධනය යොදා ලාභාලාභ බුක්ති විඳින එහෙත් කළමනාකරණ කටයුතු වලට සහභාගී නොවන වගකීම අසීමිත හවුල්කරු රහස්‍ය හවුල්කරුවේ. මොහු හවුල්කරුවකු බව මහජනයාට නොදැනෙන ආකාරයට ක්‍රියාකරන නිසා රහස්‍ය හවුල්කරු නමින් හැඳින්වේ.

6. ................................................................................................................................

හවුල් ව්‍යාපාරයකට ප්‍රාග්ධනය යොදා ලාභාලාභ භුක්තිවිඳින, එමෙන්ම කළමනාකරණ කටයුතු වල යෙදෙන, වගකීම අසීමිත වන හවුල්කරු රහස්‍ය හවුල්කරුවේ. මොහු හවුල්කරුවකු බව මහජනයාට නොදැනෙන ආකාරයට ක්‍රියාකරන නිසා රහස්‍ය හවුල්කරු නමින් හැඳින්වේ.

7. ප්‍රමුඛ හවුල්කරු

හවුල් ඔප්පුවේ හෝ හවුල් ව්‍යාපාරයට අදාළ අනෙකුත් ලියවිලිවල මුලින් ම නම සඳහන් වන සාමාන්‍ය හවුල්කරුවෙක. බදු ගෙවීම හෝ වෙනත් කටයුතු සම්බන්ධව මුලින්ම ඇමතුම් ලබන්නේ මෙම හවුල්කරු වේ.

8. ලාභ පමණක් ලබන හවුල්කරු

   ප්‍රාග්ධනයට දායක වී අසීමිත වගකීමක් දරන එමෙන්ම ලාභ පමණක් ලබන හවුල්කරු වේ. මොහු අලාභය සඳහා දායක නොවේ. මෙවැනි හවුල්කරුවන්ට ව්‍යාපාරයේ කළමනාකරණයට සහභාගී වීමට අවසර නැත.

9. ආරූඪ හවුල්කරු

   ප්‍රාග්ධනයට දායක නොවී ඒ වෙනුවට ණය මුදලක් ලබා දී වාර්ෂික ලාභය මත වෙනස් වන පොලියකට හිමිකම් කියන හවුල්කරුවෙකු වේ.

   ඇතැම් විට හවුල්කරුවකු විශ්‍රාම යාමේ දී ඔහුට ව්‍යාපාරයෙන් ලැබිය යුතු මුදල මෙසේ ණය මුදලක් ලෙස සපයයි. මොහු හවුල්කරුවකු බව මහජනයා දන්නා අතරම වගකීම අසීමිත වේ. එමෙන්ම කළමනාකරණ කටයුතු වලට ද සහභාගී නොවේ. හවුල්කරුගේ තත්ත්වය ආරූඪ කරගත් ණයහිමියෙකු ලෙස මොහු හැඳින්විය හැකිය.

10. නාමමාත්‍ර හවුල්කරු

   හවුල් ව්‍යාපාරයට ප්‍රාග්ධනය නොයොදා වෘත්තීය වශයෙන් හෝ ව්‍යාපාරිකයෙකු වශයෙන් දිනා සිටින සිය කීර්තිනාමය පමණක් යොදා ලාභ අලාභ භුක්ති විඳින හවුල්කරු මින් අදහස් වේ. මොහු ව්‍යාපාරයේ කළමනාකරණ කටයුතුවලට සහභාගී නොවන අතර වගකීම අසීමිත වේ.

## හවුල් ව්‍යාපාර විසුරුවා හැරීම

හවුල් ව්‍යාපාරයක් විසුරුවා හැරීමේ තත්ත්ව දෙකකි.

1. හවුල විසරුවා හැරීම
2. හවුල් වයාපාර ආයතනය විසුරුවා හැරීම

### 1. හවුල විසුරුවා හැරීම

හවුල්කරුවන් අතර පවත්නා සම්බන්ධතාවේ කිසියම් වෙනසක් සිදුවීම හවුල විසරුවා හැරීමක් ලෙස සැලකේ. නව හවුල්කරුවෙකු බඳවා ගැනීමේ දී හෝ විශ්‍රාම ගැනීමේ දී පවතින හවුල් ගිවිසුම අහෝසි කර නව හවුල් ගිවිසුමක් ඇතිකර ගනී. මෙසේ පැවති හවුල් ගිවිසුම අහෝසි කිරීම හවුල විසරුවා හැරීම වේ. මෙහිදී ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වා ගැනීමක් සිදු වේ

**නිදසුන් :**

A සහ B යන දෙදෙනා හවුල් වයාපාරයක් පවත්වාගෙන යයි. මේ හවුලට C නැමැති නව හවුල්කරුවකු ඇතුළත් කර ගන්නා ලදී. එහිදී A සහ B යන දෙදෙනා අතර පැවති හවුල අවසන් කරන අතර ABC නව හවුල ඇරඹේ.

## 2. හවුල් වයාපාර ආයතනය විසුරුවා හැරීම

ස්වේච්ඡාවෙන් හෝ අධිකරණයක් මගින් හවුලක් විසරුවා හැරීමේ දී හවුලේ සියළු ව්‍යාපාර කටයුතු නිමා වන්නේ නම් එය හවුල් ව්‍යාපාර ආයතනය විසුරුවා හැරීම ලෙස හැඳින්වේ.

**නිදසුන් :**

A සහ B යන දෙදෙනා හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. මෙම සම්බන්ධතාවය දෙදෙනාගේ එකඟත්වය මත අවසන් කර ව්‍යාපාරය වසා දැමීම මින් අදහස් වේ.

## හවුල් ව්‍යාපාර ආයතනය විසුරුවා හැරීම් ආකාරයන්

### 1. උසාවිය මැදිහත් වීමෙන් තොරව (ස්වේච්ඡාවෙන්) හවුල් ව්‍යාපාර ආයතනය විසුරුවා හැරීම

- හවුල් ව්‍යාපාරයේ කාලය අවසන් වීම
- නියමිත කාර්යයක් සඳහා ආරම්භ කළේ නම් එම කාර්යය අවසන් වීම
- අවිනිශ්චිත කාලයකට ආරම්භ කර ඇති විට හවුර් ව්‍යාපාර විසුරුවා හැරිය යුතු බව එක් හවුල්කරුවෙකු අනෙකුත් හවුල්කරුවන්ට දැනුම් දීම
- හවුල්කරුවකුගේ මරණය හෝ බුන්වත් වීම
- හවුල්කරුවකු ගේ බාහිර පෞද්ගලික ණයක් සඳහා ප්‍රාග්ධනය හිලව් කිරීමට සිදු වීම
- හවුල් ව්‍යාපාරය නීතිවරෝධී වීම.

## 2. අධිකරණ නියෝගයක් මත හවුල් ව්‍යාපාර ආයතනය විසුරුවා හැරීම

හවුල්කරුවන්ගේ අන්‍යෝන්‍ය එකඟත්වය මත හවුල් ව්‍යාපාරය විසුරුවා හැරීම සිදුකළ නොහැකි විටක දී හවුල්කරුවකුට හෝ කිහිපදෙනෙකුට උසාවියට පෙත්සමක් ඉදිරිපත් කරමින් හවුල් ව්‍යාපාරය විසුරුවා ලීමේ නියෝගයක් ඉල්ලා සිටිය හැකිය. එසේ කළ හැකි අවස්ථා වනුයේ,

- හවුල්කරුවකු උමතු වීම හෝ සදාකාලික සිහිවිකල් වීම
- හවුල් ව්‍යාපාරයේ තමාගේ කොටස ඉටු කිරීමට ස්ථිර වශයෙන් නොහැකි වන වෙනත් සිද්ධියක් සිදු වී ඇති විට
- හවුල් ව්‍යාපාරය පවත්වාගෙන යාමට හානිකර විය හැකි හැසිරීමක් සම්බන්ධයෙන් හවුල්කරු අධිකරණයේ වරදකරු වීම
- හවුල්කරු හිතාමතා හවුල් ගිවිසුම දැඩි ලෙස කඩ කිරීම
- හවුල් ව්‍යාපාරය දිගින් දිගටම පාඩු ලැබීම
- අධිකරණයේ මතය අනුව හවුල් ව්‍යාපාරය විසුරුවා හැරීම යොග්‍ය හා සාධාරණ ලෙසට කරුණු උත්ගතව ඇති අවස්ථාවක

## හවුල්කරුවකු බුන්වත් වීම

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

බුන්වත් හවුල්කරුවකුගේ වගකීම සම්බන්ධයෙන් අනුගමනය කළ හැකි විකල්ප ක්‍රියාමාර්ග දෙකකි. ඒ අනුව සාමූහික එකඟත්වය අනුව කටයුතු කිරීම හෝ ගානර් එදිරිව මරේ නඩු තීන්දුව අනුව කටයුතු කිරීම කළ හැකිය.

## ගානර් එදිරිව මරේ නඩු තීන්දුව අනුව කටයුතු කිරීම

බුන්වත් හහවුල්කැගේ ප්‍රමාණය නුබුන්වත් හවුල්කරුවන් ශේෂ පත්‍රයේ දැක්වෙන ප්‍රාග්ධන ගිණුම් ශේෂයන් හි අනුපාතයට යෙදවීම මෙම නඩුවෙන් ප්‍රකාශ වේ.

# බද්ධ ව්‍යාපාරය

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

එක් එක් සමාගම් වලින් වෙන් වූ නව ව්‍යාපාර ඒකකයකි. අදාළ ව්‍යාපෘතිය නිමවීමෙන් පසුව බද්ද ව්‍යාපාරයට ද නිමාවට පත් වෙවී මෙසේ බද්ද ව්‍යාපාර ආරම්භ කිරීමට බොහෝවිට හේතු වන්නේ අදාළ ව්‍යාපෘතිය තනිව එක් සමාගමකට පමණක් කළ නොහැකි වීමයි.

### බද්ධ ව්‍යාපාරයක ප්‍රධාන ලක්ෂණ

1. .............................................................................................................................
2. .............................................................................................................................
3. බොහෝ විට ව්‍යාපාරික නාමයක් හෝ නිශ්චිත ව්‍යාපාරික ස්ථානයක් නොමැති වීම
4. ලියාපදිංචිය අවශ්‍ය නොවීම
5. බලපාන විශේෂ නීති නොමැති වීම
6. අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම

### බද්ධ ව්‍යාපාරයක හා හවුල් ව්‍යාපාරයක් අතර පවතන්නා සමානකම් හා අසමානකම්

**සමානකම්**

1. .............................................................................................................................
2. .............................................................................................................................
3. අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම
4. ලියාපදිංචිය අනිවාර්ය නොවීම
5. පුද්ගලයන් කිහිප දෙනෙකු අයිතිකරුවන් ලෙස ව්‍යාපාරයට සම්බන්ධ වීම

**අසමානකම්**

| හවුල් ව්‍යාපාරය | බද්ධ ව්‍යාපාරය |
|---|---|
| 1. සාපේක්ෂ වශයෙන් දිගුකාලීන වේ | 1. කෙටිකාලීනය (තාවකාලික වේ) |
| 2. නිශ්චිත ව්‍යාපාර ස්ථානයක් හෝ නමක් පැවතීම | 2. බොහෝවිට නිශ්චිත ව්‍යාපාර ස්ථානයක් හෝ නමක් නොමැත |
| 3. හවුල් කරුවන් 2-20ත් අතර සම්බන්ධයකි | 3. අයිතිකරුවන් සංඛ්‍යාව සීමාවක් නොමැත |
| 4. ව්‍යාජ නමකින් පවත්වාගනී නම් ලියාපදිංචි කළ යුතුය | 4. ලියාපදිංචි කළ යුතු නැත |
| 5. හවුල් ව්‍යාපාර සඳහා බලපාන යම් යම් නීති රීති ඇත | 5. විශේෂයෙන් බලපාන නීතිරීති නැත |
| 6. ව්‍යාපාරය නමින් ගිණුම් තැබීම කරයි | 6. බොහෝ විට පෞද්ගලිකව ගිණුම් තැබීම කරයි |

# සංස්ථාපිත සමාගම්

## සංස්ථාපිත සමාගම් අර්ථ දැක්වීම

සමාගම් පනත යටතේ සංස්ථාපිත නෛතික පුද්ගලභාවයක් අතැති වගකීම සීමා සහිත හෝ සීමාරහිත කොටස්කරුවන්ගෙන් සමන්විත ව්‍යාපාර සංවිධාන විශේෂය වේ.

**සංස්ථාපිත සමාගම් වල දැකිය හැකි මූලික ලක්ෂණ**

| වගකීම | සීමිත හෝ අසීමිත විය හැකිය |
|---|---|
| නෛතික පුද්ගලභාවය | නෛතික දෘෂ්ටිය අනුව කොටස්කරුවන්ගෙන් වෙන් වූ නෛතික අනන්‍යතාවයක් සමාගමක් සතු වේ. |
| පැවැත්ම | අඛණ්ඩ පැවැත්මක් තිබේ. එනම් කොටස් හිමියන් ගේ ඉවත්ව යාම මරණය හෝ බුන්වත් වීම සමාගමේ පැවැත්ම කෙරෙහි බලනොපායි. |
| පාලනය | කොටස්කරුවන් විසින් පත්කරනු ලබන අධ්‍යක්ෂක මණ්ඩලයකට සමාගමේ කළමනාකරණ කටයුතු පැවරේ. |
| සංස්ථාපනය කිරීම | සංස්ථාපනය කිරීම අනිවාර්යය වන අතර එය 2007 අංක 07 දරණ සමාගම් පනත අනුව සිදු කෙරේ. |
| ගිණුම් තැබීම හා විගණනය | ගිණුම් තැබීම හා විගණනය අනිවාර්යය වන අතර සුදුසුකම් ලත් විගණකයකු මඟින් විගණනය කළ යුතු වේ. |

### සංස්ථාපිත සමාගම්වල වාසි

1. සමාගම් නාමය නීතිය ඉදිරියේ පුද්ගලයෙකු ලෙස පිළිගැනීම හෙවත් නෛතික පුද්ගල භාවයක් පැවතීම
2. විශාල ප්‍රාග්ධනයක් එකවර රැස්කරගත හැකිවීම
3. අඛණ්ඩව පැවැත්මක් තිබීම
4. මහා පරිමාණව ව්‍යාපාර කටයුතු සිදුකිරීම නිසා මහා පරිමාණ පිරිමැසුම් ලබාගත හැකිවීම
5. අයිතිකරුවන්ගෙන් කළමනාකාරීත්වය වෙනස් වීම නිසා දක්ෂ කළමනාකරුවන් සම්බන්ධ කරගත හැකිවීමෙන් කළමනාකරණය කාර්යක්ෂම වීම

### සංස්ථාපිත සමාගම්වල අවාසි

1. ආරම්භ කිරීමට විශාල පිරිවැයක් දැරීමට සිදු වීම හා සංකීර්ණ කටයුත්තක් වීම
2. නීතිමය බලපෑම අධික වීම
3. ලාභ ද්විත්ව බදු ගණනයකට ලක් වීම එනම් සමාගමේ ලාභය මත මෙන්ම කොටස්කරුවන්ට හිමිවන ලාභාංශ මත ද බදු ගෙවීමට සිදු වීම
4. විසුරුවා හැරීමේ දී වුව සංකීර්ණ ක්‍රියාදාමයක් අනුගමනය කිරීමට සිදු වීම
5. අලාභ ව්‍යාපාරය තුළම රැඳීම
6. කොටස් සංඛ්‍යාව මත ඡන්ද බලය හිමිවන බැවින් සුළු කොටස් හිමියන්ට වැඩි බලයක් හිමි නොවීම

### සමාගම් සංස්ථාපනය කිරීම

සමාගමක් සංස්ථාපනය කිරීමට පොදුවේ අනුගමනය කළ යුතු මූලික පියවර කිහිපයකි.

1. එක් එක් ආරම්භක කොටස්හිමියන් විසින් අත්සන් කරන ලද නියමිත ආකෘතියෙහි වූ ඉල්ලුම්පත්‍රය
2. සමාගම සඳහා නාමය අනුමත කරගැනීම

   ඒ සඳහා නාමය අනුමත කිරීමේ පොරම අංක A 16 දරණ පෝරමය පුරවා අදාළ ගාස්තු ද සමග තොරතුරු කවුළුවට ඉදිරිපත් කර අනුමත කරන ලද නාමයේ අංකය ලබගත යුතු වේ.
3. සාංගමික ව්‍යවස්ථාවලිය පිළියෙල කිරීම හා කොටස් හිමියන් ඊට අත්සන් කිරීම.
4. සමාගමේ අධක්ෂකවරුන් පත්කිරීම හා ඊට කැමැත්ත ප්‍රකාශ කිරීම (ආකෘති අංක 18) (203 වගන්තිය අනුව)

5. සමාගමේ ලෙකම්වරුන් පත්කිරීම හා ඊට කැමැත්ත ප්‍රකාශකිරීම (ආකෘති අංක 19) (221 වගන්තියේ (2) වන උප වගන්තිය)

6. අදාළ ලියවිලි නියමිත ආකෘතියෙන් ඉදිරිපත් කර ඇති බව තහවුරු කළ පසු එක් එක් ලියවිල්ලට නියමිත ගාස්තු හා බදු මුදල් ගෙවා රිසිට්පත ලබා ගැනීම.

7. සංස්ථාපනය සහතිකය ලබා ගැනීම හා ප්‍රසිද්ධ දැන්වීමක් පළ කිරීම

   (වැඩ කරන දින 30 ක් ඇතුළත සමාගමේ නම, අංකය සහ ලියාපදිංචි ලිපිනය ඇතුළත්ව, සංස්ථාගත කළ බව සඳහන් දැන්වීමක් රජයේ ගැසට් පත්‍රයේ සහ පුවත්වත්වල සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවලින් පළ කිරීම)

## සමාගමක් සංස්ථාපනය කිරීමට අවශ්‍ය ලියවිලි

2007 අංක 07 දරණ සමාගම් පනත අනුව සමාගමක් ලියාපදිංචි කිරීම සඳහා සමාගමේ එක් එක් ආරම්භක කොටස් හිමියන් විසින් අත්සන් කරන ලද නියමිත ආකෘතියෙහි වූ ඉල්ලුම් පත්‍රය සමග පහත ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතු වේ.

**සමාගම් පනත 4 (1) (2) වන උප වගන්තිය**

01. ........................................................................................................................

   සමාගමේ පරමාර්ථ, කොටස්හිමියන්ගේ අයිතිවාසිකම් හා බැඳීම්, කළමනාකරණය හා පරිපාලනය සම්බන්ධ තොරතුරු දැක්වෙන ලියවිල්ල වේ.

02. ........................................................................................................................

   සමාගමේ නම දැනට පවතින සමාගමක නමට සමාන හෝ අනුරූප නොවන බවට සඳහන් කරන ප්‍රකාශයක්

03. ........................................................................................................................

   ආරම්භක අධ්‍යක්ෂකවරුන් ලෙස කටයුතු කිරීමට කැමැත්ත පළ කළ අයගේ නාම ලේඛනය

04. ........................................................................................................................

   ආරම්භක ලේකම්වරයා ලෙස කටයුතු කිරීමට කැමැත්ත ප්‍රකාශ කරන ලියවිල්ල.

## සාංගමික ව්‍යවස්ථාවලිය

### සමාගම් පනත 13 වන වගන්තිය

සමාගමක පරිපාලනයට අදාළ විධි විධාන ඇතු-ලත් ප්‍රධාන ලියවිල්ල සාංගමික ව්‍යවස්ථාවලියයි.

සමාගමක් සංස්ථාපනයට අවශ්‍ය ප්‍රධාන ලියවිල්ල වන්නේ සාංගමික ව්‍යවස්ථාවලියයි. එය සමාගම හා කොටස්හිමියන් අතර පවතින ගිවිසුමක් ලෙස ද හඳුනාගත හැකිය.

2007 අංක 07 දරණ සමාගම් පනතේ පළමුවන උප ලේඛනයේ දක්වා ඇති ආදර්ශ ව්‍යවස්ථාවලිය සමාගමකට භාවිත කළ හැකි වේ. එය භාවිත නොකරන්නේ නම් සමාගම් පනතේ විධි විධාන වලට අනුව ව්‍යවස්ථාවලියක් සකස් කළ හැකිය.

### සාංගමික ව්‍යවස්ථාවලියට ඇතුළත් විය යුතු ප්‍රධාන කරුණු

1. සමාගමේ පරමාර්ථ
2. කොටස්හිමියන්ගේ අයිතිවාසිකම් හා බැඳීම්
3. සමාගමේ කළමනාකරණය හා පරිපාලනය

### සාංගමික ව්‍යවස්ථාවලියට ඇතුළත් විය යුතු ප්‍රධාන කරුණු

**(අ) කොටස් සම්බන්ධ විස්තර**

- කොටස් නිකුත් කිරීම
- කොටස් ඇරයුම් කිරීම
- ලාභාංශ බෙදාහැරීම
- කොටස් රෙජජිස්ටරය, කොටස් සහතිකය, කොටස් පැවරීම, කොටස් ප්‍රේෂණය

**(ආ) කොටස් හිමියන්ගේ රැස්වීම් වලට අදාළ රීති**

- කොටස් හිමියන්ගේ රැස්වීම් වලට අදාල රීති
- රැස්වීම් පිළිබඳ දැන්වීම්
- රැස්වීම් පැවැත්වීමේ ක්‍රම
- ඝණපූර්ණය
- සභාපති පිළිබඳ විස්තර
- ඡන්දය පිළිබඳ විස්තර
- ප්‍රතියුක්තිකයන් පිළිබඳ විස්තර
- රැස්වීම් වාර්තා පිළිබඳ විස්තර
- කොටස්හිමිකරු යෝජනා පිළිබඳ විස්තර
- සංස්ථා විසින් නියෝජිතයන් මගින් ක්‍රියාකළ හැකි බව

- කොටස් හිමියන්ගේ ඡන්දය පිළිබඳ විස්තර
- ඇරයුම් නොගෙවුවහොත් ඡන්දය දීමට ඇති අයිතිය නැති වීම
- කොටස් හිමියන්ගේ වාර්ෂික රැස්වීම් හා අතිවිශේෂ රැස්වීම්
- සම්බන්ධතා ඇති කණ්ඩායම් වල ඡන්දය දීම්
- බෙදාහැරීම් ලැබීමට, පූර්ව වක්‍රය අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමට හා රැස්වීම්වලට පැමිණ ඡන්දය දීමට හිමිකම් ලබන කොටස් හිමියන් පිළිබඳව

**(ඇ) අධ්‍යක්ෂකවරුන් හා ලේකම්**

- අධ්‍යක්ෂකවරුන් පත් කිරීම හා ඉවත් කිරීම
- අධ්‍යක්ෂකවරුන්ගේ බලතල හා කාර්යයන්
- සම්බන්ධතා ඇති අධ්‍යක්ෂකවරුන්
- අධ්‍යක්ෂකවරුන්ගේ රැස්වීම් වල කාර්යය පටිපාටිය
- සභාපති (ධූරකාලය)
- රැස්වීම් පිළිබඳ දැන්වීම
- රැස්වීම් පැවැත්වීමේ ක්‍රම
- ඝණපූර්ණය
- ඡන්දය දීම
- වාර්තා
- ඒකමතික යෝජනා සම්මතයන්
- කළමනාකරණ අධ්‍යක්ෂක සහ වෙනත් විධායක අධ්‍යක්ෂකවරුන්
- ලේකම්වරයා පිළිබඳ

**(ඈ) ගිණුම් හා විගණනය ගිණුම් වාර්තා, මූල්‍ය ප්‍රකාශන හා විගණනය ආදිය**

**(ඉ) ඈවර කිරීම හා ලේඛනයෙන් ඉවත් කිරීම**

- ඈවරකරු පත්කිරීමේ යෝජනා සම්මතය
- අතිරික්ත වත්කම් බෙදාහැරීම

### (ඊ) විවිධ

- සමාගම විසින් තබාගත යුතු ලේඛන
- ලේඛන ආදිය සම්බන්ධයෙන් අධ්‍යක්ෂකවරුන් හා කොටස්හිමියන් සතු අයිතිවාසිකම්
- සමාගමේ නාමය
- දැන්වීම්
- රක්ෂණය හා වන්දි පූර්ණය
- පුද්ගලික සමාගම් සම්බන්ධයෙන් මද වශයෙන් වෙනස් කිරීම
- අර්ථ නිරූපණය

### සමාගමක් සඳහා නමක් යෙදීම

සමාගම් පනතේ 6 වන වගන්තිය අනුව නාමය පිළිබඳ නියමයන් පහත පරිදි වේ.

1. සෑම සීමාසහිත සමාගමකම නමේ මුදලට සීමාසහිත යන වචන හෝ එහි කෙටි යෙදුම වන සී/ස යන්න යෙදිය යුතුය.
2. සෑම පෞද්ගලික සමාගමක්ම නමේ මුලට සීමාසහිත යන වචන හෝ එහි කෙටි යෙදුම වන සී/ස යන්න සහ අගට යෙදනෙ සමාගම යන වචනයට පූර්වයෙන් (පෞද්ගලික) යන වචනය හෝ එහි කෙටි යෙදුම වන (පෞද්) යන්න යෙදිය යුතුයි.

03. නිල ලැයිස්තුගත සමාගමක් වන සෑම සමාගමකම වමේ මුලට සීමාසහිත යන වචන හෝ එහි කෙටි යෙදුම වචන සී/ස යන්න සහ සමාගම යන වචනයට පූර්වයෙන් (පොදු) යන වචනය යෙදිය යුතුය.

නම භාවිතා කළ යුතු ආකාරය නිදසුනකින් පහත දැක්වේ.

**1. සීමිත පෞද්ගලික සමාගම**

- සී/ස විජය (පෞද්) සමාගම
- vijaya (Prvate) Limited
- Vijaya (Pvt) ltd

**2. නිල ලැයිස්තුගත නොවන සීමිත පොදු සමාගමක්**

- සීමාසහිත විජය සමාගම
- සී/ස විජය සමාගම
- Vijaya limited
- vijaya ltd

3. **නිල ලැයිස්තුගත සීමිත පොදු සමාගමක්**

- සීමාසහිත විජය (පොදු) සමාගම
- සී/ස විජය (පොදු) සමාගම
- vijaya Public limited company

රෙජිස්ට්‍රාර්වරයාගේ ලිඛිත අනුමැතිය ඇතිව සමාගමක් විසින් විශේෂ යෝජනා සම්මතයක් මගින් එහි නම වෙනස් කළ හැකිය.

### සමාගම් පනතේ 07 වන වගන්තිය අනුව නම් සම්බන්ධයෙන් වූ සීමා කිරීම්

1. පහත සඳහන් කර ඇති නම් භාවිත කළ නොහැකිය.
   - වෙනත් යම් සමාගමක හෝ ලියාපදිංචිකල හෝ විදේශීය සමාගමක නමට සාකල්‍යයෙන්ම අනුරූප වන නමක්
   - පුන්‍ය සමාගමක් වන්නේ නම් මිස වාණිජ මණ්ඩලය යන වචනය යෙදීම කළ නොහැකිය.
   - රෙජිස්ට්‍රාර්වරයාගේ මතය අනුව නොමග යවන සුළු නමක් යෙදීම කළ නොහැකිය.
1. ජාතියේ යහපත සැලකිල්ලට ගෙන අමාත්‍යවරයා විසින් දෙනු ලබන කැමැත්ත ඇතිව මිස පහත සඳහන් නම් භාවිත කළ නොහැකිය.
   - ජනාධිපතිවරයා හෝ ජනාධිපති යන වචන
   - නාගරික හෝ සංස්ථාපිත යන වචන
   - සමූපකාරය හෝ සමිතිය යන වචන
   - ජාතික රාජ්‍ය හෝ ශ්‍රී ලංකා යන වචන

### සමාගමේ නම හා අංකය භාවිතා කිරීම

සමාගම් පනත 12 වන වගන්තිය අනුව සමාගමක් සංස්ථාගත කිරීමෙන් අනතුරුව සමාගම් රෙජිස්ට්‍රාර්වරයා අදාළ සමාගමට අංකයක් ලබාදෙනු ලැබේ. මෙම අංකය හා සමාගමේ නම අනිවාර්යයෙන්ම පහත සඳහන් ලේඛන වල ඇතුළත් කළ යුතුය.

1. සමාගමේ සියලුම ව්‍යාපාරික ලිපිවල (ලිපි ශීර්ෂයන් හි ඇතුලත් කෙරේ)
2. සමාගමේ සියලුම දැන්වීම් වල, හා වෙනත් නිල ප්‍රකාශනවල
2. සමාගමේ ඉන්වොයිස් වල, ලදුපත් වල හා ණයවර ලිපිවල
4. සමාගමේ නිල මුද්‍රාවේ
5. සමාගම වෙනුවෙන් අත්සන් කරන ලද විනිමය බිල්පත්, පොරොන්දු නෝට්ටු, පිටසන් කිරීම්, චෙක්පත් හෝ මුදල් හෝ භාණ්ඩ ඇණවුම් වල
6. සමාගමේ නෛතික බැඳීමක් ඇතිකරන සමාගම නිකුත්කරන හෝ අත්සන් කරන වෙනත් ලේඛන වල

## සටහන

**සෑම සමාගමක් විසින්ම එහි නම සහ සමාගමේ අංකය එහි ලියාපදිංචි කළ කාර්යාලයේ පැහැදිලි ලෙස ප්‍රදර්ශනය කර තිබෙන බවට වගබලාගත යුතු වේ.**

## සංස්ථාගත කිරීමේ සහතිකය

අදාල නාමය දරන සමාගම 2007 අංක 07 දරණ සමාගමම්පනත යටතේ වූ සියළු නියමයන් සපුරා නිශ්චිත දිනයක සිට සමාගමක් ලෙස සංස්ථාගතව ඇති බව සහතික කිරමින් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරන සහතිකයයි. මෙය සම්මුති සහතිකය, සංස්ථාපන සහතිකය ලෙස ද හැඳින්වේ.

## සංස්ථාගත කිරීමේ සහතිකයෙහි අඩංගු වන තොරතුරු

1. සමාගමේ නම සහ අංකය
2. සමාගම සංස්ථාගත කරන ලද දිනය
3. සමාගම සීමා සහිත සමාගමක්ද, සීමාරහිත සමාගමක්ද, ඇපයෙන් සීමිත සමාගමක් ද යන වග
3. සමාගම පෞද්ගලික සමාගමක් ද යන වග
5. සමාගම අක්වෙරළ සමාගමක්ද යන වග

## සමාගමකට සංස්ථාගත කිරීමේ සහතිකයේ ඇති වැදගත්කම

1. සමාගම සංස්ථාගත කිරීමට අදාළව සමාගම් පනතේ සියළුම නියමයන්ට අනුව ක්‍රියාකර ඇති බවට සාක්ෂියක් වීම
2. එම සහතිකයේ සඳහන් දිනයේ දී සමාගම් පනත යටතේ සමාගම සංස්ථාගතකර ඇති බවට සාක්ෂියක් වීම

## සීමාසහිත සමාගමක් තනි පුද්ගලයෙකු විසින් ඇරඹීම

සමාගම් පනතේ 4 (2) වගන්තිය අනුව සමාගමක කොටස්හිමියන් දෙදෙනෙකුතට වඩා අඩුවෙන් නොසිටිය යුතුය. එසේ වුවද කොටස් හිමියා ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙනුවෙන් කොටස් දරන භාණ්ඩාගාරයේ ලේකම්වරයා හෝ පුද්ගලයෙකු හෝ සංස්ථාවක් වන විට සමාගමක තනි කොට්හිමියෙකු සිටිය හැකිය.

ඒ අනුව 2007 අංක 07 දරණ සමාගම් පනත මගින් තනි පුද්ගලයෙකුට වුවද සමාගමක් ආරම්භ කිරීමට අවස්ථාව සලසා දී තිබේ. තනි කොටස්හිමි සමාගම් රජයට හෝ පුද්ගලයෙකුට ආරම්භ කළ හැකිය.


සමාගමක් යනු පුද්ගලයන් කිහිප දෙනෙකුගේ එකතුවකි. සමාගම පිළිබ1ද මෙම සංකලප්ය සමාගම් පනතේ සඳහන් එක් කොටස් හිමියෙකට වුවද සමාගමක් පිහිටුවිය හැකිය යන වගන්තියෙන් උල්ලංඝනය වී ඇත.

## එක් කොටස්හිමියෙකුට වුවද සමාගමක් ආරම්භ කිරීමට අවස්ථාව සලසා දීමෙන් රජය අපේක්ෂා කරන අරමුණු

1. තනි ව්‍යාපාරිකයෙකු ගේ (පුද්ගලයෙකු ගේ) වත්කම් ආරක්ෂා කරගැනීම
2. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින්ට සමාගම් ආරම්භ කර සමාගම්වලට හිමි වරප්‍රසාද භුක්ති විඳීමට අවස්ථාව ලබාදීම
3. වෘත්තිකයන්ගේ ව්‍යාපාර සඳහා සමාගම්වලට හිමි වරප්‍රසාද භුක්ති විඳීමට අවස්ථාව ලබාදීම
4. කේවල ස්වාමි ව්‍යාපාර බිහිවීමට වඩා සමාගම් ලෙස ඒවා ව්‍යාප්ත කර වීම.

## සමාගම් පනත අනුව සංස්ථාපනය කළ හැකි විවිධ සමාගම් වර්ග

සමාගම් පනත අනුව මූලික වශයෙන් සමාගම් වර්ග 03 කි. එනම් සීමාසහිත සමාගම්, සීමාරහිත සමාගම්, සහ ඇපයෙන් සීමිත සමාගම් වේ. මෙම ප්‍රධාන සමාගම් වලට අමතරව පහත දැක්වෙන සමාගම්වලට අදාළ විධිවිධාන ද සමාගම් පනතේ දැක්වේ. ඒ අනුව පුණ්‍ය සමාගම්, අක්වෙරළ සමාගම් සහ විදේශ සමාගම් ද ආරම්භ කළ හැකිය.




.............................................................................................................................................

කොටස්කරුවන්ගේ වගකීම සාංගමික ව්‍යවස්ථාවලියේ සඳහන් පරිදි කොටස්කරුවන්ට නිකුත් කරන ලද කොටස් ප්‍රමාණයට සීමා නොවන සමාගම් වෙවි නැතහොත් සමාගමේ වගකීම් බේරුම් කිරීම සඳහා අසීමිතව වග කියන කොටස්හිමියන්ගෙන් යුක්ත සමාගම් වෙවි

.............................................................................................................................................

කොටස්කරුවන් මිලදීගත් කොටස් වෙනුවෙන් ගෙවූ හෝ ගෙවීමට බැඳී සිටින වටිනාකමට පමණක් ඔවුන්ගේ වගකීම සීමාවන සමාගම් වේ. මෙම සමාගම් සීමාසහිත පුද්ගලික සමාගම්, සීමා සහිත පොදු සමාගම් හෝ අක්වෙරළ සමාගම් ලෙස සංස්ථාපනය කිරීම කළ හැකිය.

.............................................................................................................................................

සමාගම ඈවර කරන අවස්ථාවක දී සාංගමික ව්‍යවස්ථාවලියේ සඳහන් නිශ්චිත ප්‍රමාණයක් දක්වා පමණක් බාහිර ණය සම්බන්ධයෙන් වගකීමට එකඟ වූ සාමාජිකයයින් සිටින සීමිත සමාගම් වේ.

ඇපයෙන් සීමිත යන්නෙහි අර්ථය වන්නේ යම් දිනක සමාගම බුන්වත් වී හෝ වෙනත් හේතුවක් නිසා හෝ සමාගම ඈවර කරන අවස්ථාවක බාමහිර ණය පියවීමට ප්‍රමාණත් මුදල් නොමැති වුවහොත් ඒ සඳහා අවශ්‍ය අරමුදල් සැපයීමට සාමාජිකයින් බැඳී සිටීම හො ඇපවීමයි. සමාගම ආරම්භ කරන අවස්ථාවේ දීම ඒ ඒ සාමාජිකයා ඇපවන ප්‍රමාණය (ඇපකර) ලබා දිය යුතුය.

### ඇපයෙන් සීමිත සමාගමක මූලික ලක්ෂණ

1. කොටස් නිකුත් කිරීමක් සිදු නොකිරීම - සාංගමික ව්‍යවස්ථාවලියේ එක් එක් සාමාජිකයා විසින් සමාගම ඈවර කිරීමේ දී දායක විය යුතු ප්‍රමාණයන් සඳහන් කළ යුතු වීම
2. අවම වශයෙන් සාමාජිකයින් දෙදෙනෙකු වත් සිටිය යුතු වීම (උපරිමය සීමාවක් නැත)
3. පොදු පරමාර්ථ පෙරදැරිකරගෙන ආරම්භ කිරීම
4. සමාගමේ ලාභ බෙදාහැරීමක් සිදු නොකිරීම

### පුණ්‍ය සමාගම්

වාණිජ්‍ය, කළාව, විද්‍යාව, ආගම, පුණ්‍ය කටයුතු, ක්‍රීඩා හෝ වෙන්ත් ප්‍රයෝජනවත් පරමාර්ථයක් ප්‍රවර්ධනය සඳහා පමණක් ම යොදනු ලබන ඒසේම සාමාජිකයන්ට ලාභාංශ ගෙවීම තහනම් වන ඇපයෙන් සීමිත සමාගමක් ලෙස හෝ සීමාසහිත සමාගමක් ලෙස පිහිටුවීමට හැකි සමාගම් විශේෂය වේ. පුන්‍ය සමාගම් වල පහත ලක්ෂණ දැකිය හැකිය.

- සමාජ සුබසාධනය අරමුණු වීම
- ලබන ලාභය හෝ ආදායම සමාජ සුබසාධනය සඳහාම යොදවන බව
- සාමාජිකයින් අතර ලාභාංශ නොබෙදෙන බව

**නිදසුන්**

1. ලංකා ඔටෝ මොබයිල් සංගමය
2. කොළඹ තරුණ බෞද්ධ සංගමය
3. සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරය

### අක්වෙරළ සමාගම්

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

### විදේශීය සමාගම්

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

මේවා අනේවාසික, නිර්නේවාසික, නිර්වාසික, එතෙර සමාගම් යනාදී නම් වලින් ද හැඳින්වේ. විදේශ සමාගමක් ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරික ස්ථානයක් ස්ථාපිත කර මසක් ඇතුලත දී සමාගම පිළිබඳ විස්තරයක් ශ්‍රී ලංකාවේ සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වේ. සමාගම් රෙජිස්ට්‍රාර්වරයා සමාගම පිළිබඳ පරීක්ෂා කර බලා එම විදේශීය සමාගම ලියාපදිංචි කළ විදේශීය සමාගමක් ලෙස විදේශීය සමාගම් ලේඛනයේ ඇතුළත් කරයි. විදේශීය සමාගම් මෙරට සමාගම් පනත යටතේ සංස්ථා ගත නොකරන අතර ලියාපදිංචිය පමණක් සිදු කරයි.

### පෞද්ගලික සමාගම්

#### පෞද්ගලික සමාගම් අර්ථ දැක්වීම

සමාගමේ ප්‍රාග්ධනය සපයා ගැනීමට ප්‍රසිද්ධියේ කොටස් නිකුත් නොකරන නෑදෑ හිතමිතුරන්ගෙන් පමණක් ප්‍රාග්ධනය සපයා ගන්නා සමාගම් සීමිත පෞද්ගලික සමාගම් ලෙස හැඳින්වේ. ඒ අනුව මෙහි පෞද්ගලික යන පදයෙන් අදහස් කරන්නේ ප්‍රසිද්ධියේ කොටස් නිකුත් කිරීමට හෝ නිදහසේ කොටස් පැවරීමට නොහැකි බවයි. 2007 අකං 07 දරන සමාගම් පනතේ 27 වන වගන්තියේ සීමිත පෞද්ගලික සමාගම් නිර්වචනය කර ඇත්තේ, **සාංගමික ව්‍යවස්ථාවලියෙන්, සමාගම විසින් නිකුත් කරන කොටස් හෝ වෙනත් සුරැකුම්පත් මහජනයාට අර්පනය කිරීම තහනම් කරන, සහ උපරිම කොටස් හිමියන් සංඛ්‍යාව 50 කට සීමා කරන සිමිත සමාගම් විශේෂය ලෙසයි.**

#### පෞද්ගලික සමාගම් වල ප්‍රධාන ලක්‍ෂණ

| | |
|---|---|
| අයිතිය | කොටස්කරුවන් සතු වීම |
| ප්‍රාග්ධනය | කොටස් නිකුත්කිරීමෙන් සපයා ගනී. ප්‍රසිද්ධියේ කොටස් නිකුත් කිරීම තහනම් වන අතර නිදහසේ කොටස් පැවරීමට නොහැකිය. |
| කොටස්කරුවන් සංඛ්‍යාව | අවමය 01, උපරිමය 50 |
| කළමනාකරණය | අධ්‍යක්‍ෂක මණ්ඩලයක් මඟින් සිදුවේ. අවමය 01 වන අතර උපරිමය සීමාවක් නැත. |
| පාලනය | ව්‍යවස්ථාපිත පාලනයට හා කොටස්කරුවන්ගේ සාමූහික පාලනයට යටත් වේ. |
| නෛතික පුද්ගලභාවය | නෛතික පුද්ගලභාවයක් ඇත. |
| වගකීම | සීමාසහිත වේ. |
| පැවැත්ම | අඛණ්ඩ පැවැත්මක් ඇත. |
| සංස්ථාපනය | සමාගම් පනත අනුව සංස්ථාපනය අනිවාර්යය වේ. |

| | |
|---|---|
| ගිණුම් තැබීම හා විගණනය | අනිවාර්ය වේ. නමුත් ගිණුම් වාර්තා වසමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරන්නේ ඉල්ලා සිටියොත් පමණි. |
| බදු ගෙවීම | සමාගම නමින් බදු ගෙවිය යුතුය. |
| ඈවර කිරීම | ස්වේච්ඡාවෙන්, අධිකරණ නියෝගයකින් හා අධිකරණයේ අධීක්ෂණය යටතේ ඈවර කිරීම කළ හැකිය. |
| සමාගමේ නාමය | සමාගමේ නම සඳහන් කිරීමේ දී නමේ මුලට සීමාසහිත යන වචන හෝ එහි කෙටි යෙදුම වන සී/ස යන්න සහ අගයට යෙදෙන සමාගම යන වචනයට පූර්වයෙන් (පෞද්ගලික) යන වචනය හෝ එහි කෙටි යෙදුම වන (පෞද්) යන්න යෙදිය යුතුයි. |
| ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණය පැවැත්වීම | ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණයකින් තොරව සියළුම කොටස්කරුවන්ගේ කැමැත්ත මත ලාභාංශ බෙදාහැරිය හැකිය. |
| සම්බන්ධතා රෙජිස්ටරය පවත්වා ගැනීම | කොටස්කරුවන්ගේ ඒකමතික යෝජනා සම්මතයකින් අධ්‍යක්ෂක මණ්ඩලය සමාගම සමග කරන ගනුදෙනු විස්තරාත්මකව දැක්වෙන සම්බන්ධතා රෙජිස්ටරය පවත්වාගෙන යාමෙන් වැළකිය හැකිය. |

**පෞද්ගලික සමාගම්වල වාසි**

1. අයිතිය පවුලේ ඥාතීන් හිතවතුන් අතරේ පවත්වාගෙන යා හැකි වීම
2. සමාගමේ පාලන බලය සීමිත පිරිසක් අතරේ රඳවා ගැනීමට හැකි වීම
3. ලාභය සීමිත පිරිසක් අතරේ බෙදාගැනීමට හැකි වීම.
4. වැඩි ප්‍රාග්ධනයක් රැස්කරගත හැකි වීම
5. වගකීම සීමිත වීම
6. නීතිමය පුද්ගලභාවයක් පැවතීම
7. පොදු සමාගම් වලට සාපේක්ෂව නිතිමය බලපෑම අඩු වීම.
8. අඛණ්ඩව පැවැත්මක් හිමි වීම
9. අධ්‍යක්ෂක මණ්ඩලය මගින් කළමනාකරණය නිසා කළමනාකරණය කාර්යක්ෂම වීම
10. කොටස්කරුවන් සියළු දෙනාගේ ඒකමතික යෝජනා සම්මතයකින් රැස්වීම් පැවැත්වීමෙන් තොරව සමාගමේ බොහෝ කටයුතු ඉටුකිරීමේ හැකියාව ලැබීම
11. ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණයකින් තොරව කොටස් හිමියන් වෙත ලාභාංශ බෙදා හැරීමට හැකි වීම
12. විවිධ බදු සහන ලැබීමේ හැකියාව

**පෞද්ගලික සමාගම්වල අවාසි**

1. පොදු සමාගම් වලට සාපේක්ෂව අඩු ප්‍රාග්ධන සම්පාදනයක් සිදු වේවි
2. කොටස් වෙළෙඳපොළේ ලේඛනගත විය නොහැක. / නිල ලැයිස්තුගත සමාගමක් වීමට නොහැකිය.
3. කොටස් නිදහසේ පැවරීම කළ නොහැකි වීම
4. සමාගම් පනතේ නීතිමය අවශ්‍යතා ඉටු කළ යුතු වීම
5. සංස්ථාපනය කිරීම සංකීර්ණ වීම හා ඉහළ පිරිවැයක් දැරීමට සිදු වීම
6. පරිපාලන වියදම් අධික වීම

## පොදු සමාගම්

සමාගමේ කොටස් ප්‍රාග්ධනය සඳහා ප්‍රසිද්ධියේ ජනතාව සහභාගී කරවා ගත හැකි සමාගම් පොදු සමාගම් වේ. මෙහි පොදු යන පදයෙන් අදහස් කරන්නේ ප්‍රසිද්ධියේ කොටස් නිකුත් කිරීම හෝ නිදහසේ කොටස් පැවරීම කළ හැකි බවයි.

**සීමිත පොදු සමාගමක ප්‍රධාන ලක්ෂණ**

| **අයිතිය** | **කොටස්කරුවන් සතු වීම** |
|---|---|
| ප්‍රාග්ධනය | කොටස් නිකුත්කිරීමෙන සපයා ගනී. ප්‍රසිද්ධියේ කොටස් හෝ වෙනත් සුරැකුම්පත් නිකුත් කළ හැකිය. |
| කොටස්කරුවන් සංඛ්‍යාව | අවමය 01, උපරිමය සීමාවක් නෑ |
| කළමනාකරණය | අධ්‍යක්ෂක මණ්ඩලයක් මගින් සිදුවේ. අවමය 02 වන අතර උපරිමය සීමාවක් නැත. |
| පාලනය | ව්‍යවස්ථාපිත පාලනයට හා කොටස්කරුවන්ගේ සාමූහික පාලනයට යටත් වේ. |
| නෛතික පුද්ගලභාවය | නෛතික පුද්ගලභාවයක් ඇත. |
| වගකීම | සීමාසහිත වේ. |
| පැවැත්ම | අඛණ්ඩ පැවැත්මක් ඇත. |
| සංස්ථාපනය | සමාගම් පනත අනුව සංස්ථාපනය අනිවාර්යය වේ. |
| ගිණුම් තැබීම හා විගණනය | අනිවාර්ය වේ. |
| බදු ගෙවීම | සමාගම නමින් බදු ගෙවිය යුතුය. |
| ඈවර කිරීම | ස්වේච්ඡාවෙන්, අධිකරණ නියෝගයකින් හා අධිකරණයේ අධීක්ෂණය යටතේ ඈවර කිරීම කළ හැකිය. |

| | |
|---|---|
| සමාගමේ නාමය | සමාගමේ නම සඳහන් කිරීමේ දී නමේ මුලට සීමාසහිත යන වචන හෝ එහි කෙටි යෙදුම වන සී/ස යන්න යෙදිය යුතුයි |
| ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණය පැවැත්වීම | කොටස්කරුවන්ට ලාභාංශ ගෙවීමට පෙර ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණයක් පැවැත්විය යුතු වේ. |
| සම්බන්ධතා රෙජිස්ටරය පවත්වා ගැනීම | අධ්‍යක්ෂක මණ්ඩලය සමාගම සමග කරන ගනුදෙනු විස්තරාත්මක ව දැක්වෙන සම්බන්ධතා රෙජිස්ටරය පවත්වා ගත යුතුය. |
| ඡන්ද බලය | සෑම සාමාජිකයෙකුටම ඔහු දරන කොටස් ප්‍රමාණය අනුව ඡන්ද බලය හිමි වේ. |
| කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත වීමේ හැකියාව | කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ ලැයිස්තු-ගත කළ හැකිය. |

## නිල ලැයිස්තුගත සමාගම්

කොටස් වෙළෙඳපොළෙහි කොටස් අලෙවි කිරීමට ලේඛනගත වී ඇති සීමිත පොදු සමාගම් වේ. නිල ලැයිස්තුගත පොදු සමාගමක නම සඳහන් කිරීමේ දී සීමාසහිත හෝ සී/ස යන්න සහ අගට යෙදෙන සමාගම යන වචනයට පෙර පොදු යන වචනය යෙදිය යුතුය.

**සීමිත පොදු සමාගම්වල වාසි**

1. ....................................................................................................................................
2. ....................................................................................................................................
3. ....................................................................................................................................
4. ....................................................................................................................................
5. ණය ප්‍රාග්ධනය සපයා ගැනීම පහසු වීම / ණයකර ප්‍රසිද්ධියේ නිකුත් කළ හැකි වීම
6. කොටස් නිදහසේ පැවරිය හැකි වීම
7. කොටස් වෙළෙඳපොළට පිවිස නිල ලැයිස්තුගත සමාගමක් විය හැකි වීම.
8. මහාපරිමාණ ව්‍යාපාර කටයුතු වල නියුක්ත වීමෙන ආර්ථික පිරිමැසුම් ලඟාකර ගත හැකි වීම.
9. අධ්‍යක්ෂක මණ්ඩලය මගින් කළමනාකරණය නිසා කළමනාකරණය කාර්යක්ෂම වීම
10. දක්ෂ කළමනාකරුවන් ඉහළ වැටුප් යටතේ බඳවා ගෙන ව්‍යාපාර කටයුතු කරගෙන යා හැකි වීම / ඉහළ මට්ටමේ මානව සම්පත් ඒකරාශී කළ හැකි වීම.
11. ද්‍රවශීලතාවය ඉහළ වීම
12. විවිධ බදු සහන ලැබීමේ හැකියාව
13. අයෝජකයන් ආකර්ෂණය කර ගැනීම පහසු වීම.

**සීමිත පොදු සමාගම්වල අවාසි**

1. ..........................................................................................................................
2. ..........................................................................................................................
3. ..........................................................................................................................
4. ..........................................................................................................................
5. ..........................................................................................................................
6. වෙනත් සමාගමක පරිපාලිතයක් වීමේ අවදානම පැවතීම
7. කොටස් සංඛ්‍යාව මත ඡන්ද බලය හිමි වන නිසා සුළු කොටස්කරුවන්ට වැඩි බලයක් හිමි නොවීම
8. කළමනාකරණය සංකීර්ණ වීම හා දුෂ්කර වීම
9. තීරණ ගැනීමේ ප්‍රමාදයන් ඇති වීම

**සීමිත පොදු සමාගම් වලින් ආර්ථිකයට අත්වන ප්‍රතිලාභ**

1. දළ ජාතික නිෂ්පාදනයට වැඩි දායකත්වයක් ලැබීම
2. රැකියා අවස්ථා විශාල ප්‍රමාණයක් ජනනය වීම
3. තරඟයට සාර්ථකව මුහුණ දිය හැකි වීම
4. නවීන තාක්ෂණය යොදා ගැනීම
5. කොටස් වෙළෙඳපොළේ ලියාපදිංචි වන සංඛ්‍යාව වැඩි වීමෙන් කොටස් වෙළෙඳපොළ සංවර්ධනය වීම
6. කොටස් වෙළෙඳපොළ සංවර්ධනය වීමෙන් පොදු ජනතාවගේ ඉතිරිකිරීම් කොටස් වෙළෙඳපොළට ගලා ඒම හා ආර්ථිකය තුළ ඉතුරුම් වර්ධනය වීම.

**සංස්ථා ප්‍රකාශය**

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

එය දැන්වීමක්, චක්‍රලේඛයක්, ප්‍රචාරණ දැන්වීමක් හෝ වෙනයම් ආකාරයක් විය හැකිය. සංස්ථා ප්‍රකාශයක් ලියාපදිංචි කිරීම සඳහා සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවි යුතු වේ. මෙම සංස්ථා ප්‍රකාශය නීතිමය අවශ්‍යතාවලට අනුව පිළියෙල කළ යුතු අතර ඒ සඳහා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගත යුතුය. එහි අන්තර්ගත කරුණු අතර සමාගමේ පරමාර්ථ සහ ව්‍යාපාර කටයුතු ප්‍රධාන නිළධාරීන්ගේ පසුබිම හා සුදුසුකම්, වර්තමාන මූල්‍ය තත්ත්වය, උපකල්පන සහිත ප්‍රක්ෂේපිත මූල්‍ය ප්‍රකාශන, අවදානම් විශ්ලේෂණය, කොටස් නිකුතු මිල, ණයකර සඳහා ලබා දෙන පොළිය සහ මූලික ගෙවීම් විස්තර ඇතුලත් වේ.

## කොටස් බලපත්‍රය

වර්තමානයේ ගිවිසගත් මිලකට අනාගතයේ දී කිසියම් සමාගමක කොටස් මිලදී ගැනීමේ අයිතිය ලබාදෙමින් නිකුත් කරන ලියවිල්ල කොටස් බලපත්‍රයයි. කොටස් හිමියාගේ නම සඳහන් නොකර සමාගමේ නිල මුද්‍රාව තබා නිකුත්කරන මෙය ගනුදෙනු කළ හැකි ලියවිල්ලකි. කොටස් බලපත්‍රය හිමි පුද්ගලයා එම සමාගමේ නීත්‍යානුකූල කොටස් හිමියෙකු නොවේ. එය ඇතැති පුද්ගලයා සමාගම විසින් තීරණය කරන ලාඑබාංශ සදහා හිමිකම් පායි. කූපන් ක්‍රමයක් මගින් මේ සඳහා ලාභාංශ ගෙවනු ලැබේ.

## කොටස් සහතිකය

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

### කොටස් සහතිකයක අඩංගු මූලික තොරතුරු

- සමාගමේ නම
- කොටස්හිමියාගේ නමව
- ලබාගත් කොටස් සංඛ්‍යාව
- කොටසක් සඳහා දැනට ගෙවා ඇති වටිනාකම
- කොටස් සහතිකයේ අනුක්‍රමික අංකය
- සමාගමේ නිල මුද්‍රව
- අධක්ෂක ලේකම්ගේ අත්සන

### වාර්ෂික වාර්තාව

පූර්ව වර්ෂයේ සිදු වූ සම්පූර්ණ ක්‍රියාවන් වල විස්තරාත්මක වාර්තාව හැඳින්වේ. වාර්ෂික වාර්තාව හැඳින්වේ. වාර්ෂික මගින් කොටස්කරුවන්ට සහ අනෙකුත් පාර්ශවයන්ට සමාගමේ කටයුතු පිළිබඳ තොරතුරු සහ මූල්‍ය කාර්යය සාධනය පිළිබඳ තොරතුරු ලබාදීමට බලාපොරොත්තු වේ.

## සමූපකාරය

### නිර්වචනය

සිය ආර්ථික, සමාජීය හා සංස්කෘතිකමය අපේක්ෂාවන් ඉටුකරගැනීම උදෙසා ස්වේච්ඡාවෙන් එක්සත් වූ පුද්ගලයින්ගේ සාමූහික අයිතිය සහිතව පවත්වාගෙන යන, ප්‍රජාතන්ත්‍රවාදී ලෙස පාලනය වන ස්වාධීන ව්‍යාපාර ඒකකයකි.

### සමූපකාර ව්‍යාපාරයේ සුවිශේෂී ලක්‍ෂණ

1. ගනුදෙනුකරුවනට අයිතිය හිමි වන ව්‍යාපාර සංවිධාන වර්ගයක් වීම
2. යෙදූ මුදල හෝ සවෙය සැලකිල්ලට නොගනෙ එක් සාමාජිකයෙකුට එක් ඡන්දය බැගින් හිමි වීම
3. කොටස් වල අගය වෙනස් නොවී පැවතීම
4. උපයන සියළුම අතිරික්ත ආදායම සාමාජිකයින් සතු වේ. අතිරික්තයෙන් කොටසක් අනාගත ආයෝජනයට වෙන් කරන අතර ඉතිරිය ගිවිසගත් පරිදි සාමාජිකයින් අතර බෙදා හරියි. (අනුග්‍රාහක ප්‍රතිගෙවීම් / අනුග්‍රාහක දීමනාවන්)
5. ණය සඳහා ගෙවිය හැකි පොළී මට්ටම සීමිත වීම.
6. ලාභය මූලික අරමුණ නොවීම
7. සාමාජික හා සාමාජික යහපත උදෙසා කටයුතු කිරීම

**සමූපකාර ව්‍යාපාරයේ ලක්ෂණ**

| | |
|---|---|
| සාමාජිකත්වය | කොටස් මිලදී ගැනීම තුලින් සාමාජිකත්වය ලබාගත හැකිය. දැනට කොටසක අවම වටිනාකම රු. 100/- කි. අවම සාමාජිකයින් ගණන 10 කි. |
| ප්‍රාග්ධනය | සාමාජිකයින්ට කොටස් විකිණීමෙන් හා රජයේ අරමුදල් මගින් ප්‍රාග්ධනය සපයා ගනී. |
| ලියාපදිංචිය | 1972 අංක 05 දරණ සමූපකාර පනත යටතේ ලියාපදිංචිය කොමසාරිස්වරයා විසින් සිදු කරයි. |
| නීතිමය පුද්ගලභාවය | නීතිමය පුද්ගලභාවයක් ඇත |
| පරිපාලනය | සාමාජිකයින් මහා සභා රැස්වීමේ දී පත් කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සිදුවේ. |
| වගකීම | සාමාජිකයින් මිලදී ගත් කොටස් වල නාමික අගයට සීමා වේ. එහෙත් සීමාරහිත ණය දෙන සමිති වල වගකීම සීමා රහිත වෙව් |
| ගිණුම් තැබීම හා විගණනය | සමූපකාර ව්‍යාපාරයට විශේෂිත වූ ගිණුම් තැබීමක් අනුගමනය කරන අතර එය අනිවාර්යයෙන්ම අනුගමනය කළ යුතු වේ. |
| විසුරුවාහැරීම | සමූපකාර සමිතියක් විසුරුවා හැරීමට හෝ ලියාපදිංචිය අවලංගු කිරීමට සමූපකාර කොමසාරිස්වරයාට බලය පවරා ඇත. |

# වරලත් ව්‍යාපාර

**වරලත් ව්‍යාපාරයක් යනු**

කිසියම් නිෂ්පාදිතයක් පිළිබඳ නිෂ්පාදනය, සේවය හෝ විකිණීම පිළිබඳ සමාගමක් සතු අයිතිය වෙනත් ව්‍යාපාරයකට ලබා දීමයි. මෙහිදී නිෂ්පාදිතයේ අයිතිය ඇති සමාගම වෙළෙඳනාමය භාවිතා කිරීමට වෙනත් ආයතනයකට අවසර ලැබේ. වරලත් ව්‍යාපාර සම්බන්ධතාව තුළ හඳුනාගත හැකි පාර්ශව 02 කි.

1. සමාගමේ වෙළෙඳ නාමය යටතේ භාණ්ඩ විකිණීමට අවසර දෙනු ලබන මව් ආයතනය

2. මව් ආයතනයෙන් අවසර ලබා ගන්නා වරලත් ලාභී ආයතනය

වරලත් හිමියා සහ වරලත්ලාභියා අතර ඇතිවන ගිවිසුම වරලත් ගිවිසුම ලෙස හැඳින්වෙන අතර ගිවිසුමේ ප්‍රතිෂ්ටාව වන වරලත්ලාභියා විසින් වරලත් හිමියා වෙත මාසිකව ගෙවිය යුතු ගාස්තුව පුරස්කතාරය ලෙස හැඳින්වේ.

**වරලත් ව්‍යාපාර වර්ග කිරීම**

- ........................................................................................................................
- ........................................................................................................................
- ........................................................................................................................

**නිෂ්පාදන වරලත් ව්‍යාපාර**

මෙම ව්‍යාපාර භාණ්ඩ නිෂ්පාදනය කර බෙදා හැරීමට වරලත්ලාභියාට අයිතිය පැවරෙන ව්‍යාපාරයි. වරලත් ව්‍යාපාරිකයාගේ වෙළෙඳ ලකුණ යටතේ භාණ්ඩ නිෂ්පාදනය කරයි.

නිදසුන් - කොකාකෝලා, පෙප්සි

**නිෂ්පාදිත වරලත් ව්‍යාපාර**

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

ඛනිජ තෙල් විකිණීමේ ස්ථාන (ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වරලත්ලාභී ව්‍යාපාර)

**ව්‍යාපාර ක්‍රමය සඳහා වූ (බලලත්) වරලත් ව්‍යාපාර**

..............................................................................................................................

..............................................................................................................................


..............................................................................................................................

KFC, Pizza Hut

# පොදු අංශයේ / රාජ්‍ය අංශයේ ව්‍යාපාර

හිමිකාරීත්වය රජය, පලාත් සභා හෝ පළාත් පාලන ආයතන සතු වන ජනතාවට ප්‍රතිලාභ ලබා දීම සඳහා පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර පොදු ව්‍යවසායන් ලෙස හැඳින්වේ.

## පොදු ව්‍යවසායන් වර්ග කිරීම




## රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශය සැසඳීම

| රාජ්‍ය අංශය | පෞද්ගලික අංශය |
|---|---|
| අයිතිය මධ්‍යම රජයට හෝ පළාත් ආණ්ඩුවකට අයත් වේ. | එක් පුද්ගලයෙකුට හෝ පුද්ගල කණ්ඩායමකට අයත් වේ. |
| මූල්‍ය මාර්ග සමන්විත වන්නේ මහජන අරමුදල් වලින් වේ. | පුද්ගලයින් හා ආයතන මූල්‍ය සම්පාදනය කරන අතර එය තනි පුද්ගලයින්, හවුල්කරුවන්, හා කොටස්කරුවන්ගෙන්ද වෙනත් මූල්‍ය මාර්ග වලින් ද සපයා ගනීත. |
| ප්‍රධාන අරමුණ ජනතා සේවය නැතහොත් සුබ සාධනය යි. | ප්‍රධාන අරමුණ ලාභයයි. |

**පොදු හිමිකාරීත්වය යටතේ ව්‍යාපාර පවත්වාගෙන යාමට බලපා ඇති විවිධ හේතු**

1. ඒකාධිකාරය පාලනය කිරීම
2. ලාභදායී නොවන එහෙත් මහජනයාට අත්‍යාවශ්‍ය සේවා පත්වාගෙන යාමට
3. පෞද්ගලික අංශය විසින් අධික ලාභ ලැබීම නිසා ජනතාවට වන හානිය අවම කිරීම
4. වැදගත් මහා පරිමාණ සංවර්ධන ක්‍රම පවත්වා ගැනීම
5. නාස්තිය අවම කිරීම
6. පෞද්ගලික අංශය සමග තරඟ කිරීමට ඇති අවශ්‍යතාව
7. සමාජ සුබසාධන සේවා පවත්වාගෙන යාමේ අවශ්‍යතාව
8. ජාතික ආරක්ෂාවට සිදු විය හැකි තර්ජන අවම කිරීම

## රාජ්‍ය සංස්ථා

සමාගම් පනත හැර වෙන්ත ලිඛිත නීතියක් යටතේ පිහිටුවනු ලද්දා වූ ද හෝ රජය විසින් ප්‍රධානයක් හෝ ණයක් වහයෙන් නැතහොත් වෙනත් ආකාරයකින අරමුදල් සපයන්නා වූ ආයතනයකි.

රාජ්‍ය සංස්ථා පිහිටු විය හැකි ආකාර දෙකකි.

**1. පොදු පාර්ලිමේන්තු පනතක් මගින් (සංස්ථාපන නියෝගයක් මගින්)**

නිදසුන්

- 1985 අංක 15 දරන ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු පනත (වර්තමානයේ ක්‍රියාත්මක නොවේ)
- ● ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු
- 1957 දංක 49 දරණ කාර්මික නීතිගත සංස්ථා පනත
- ● ලංකා තුනී ලෑලි සංස්ථාව
- ● ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය

**2. විශේෂ පාර්ලිමේන්තු පනතක් මගින්**

නිදසුන්

- 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත
- ● පාරිභෝගික කටයුතු පිළිබඳ අ්ධිකාරිය
- 1961 අංක 29 දරණ මහජන බැංකු පනත
- ● මහජන බැංකුව

## රාජ්‍ය සංස්ථා හඳුන්වන විවිධ නම්

රාජ්‍ය නීතිගත සංස්ථාව, සමායතනය, සංයුක්ත මණ්ඩලය, කොමිසම, අධිකාරිය, කොමිෂන් සභාව, මණ්ඩලය, කාර්යාංශය

## රාජ්‍ය සංස්ථාවක මූලික ලක්‍ෂණ

| | |
|---|---|
| අයිතිය | පූර්ණ වශයෙන් රජයට හෝ වැඩි ප්‍රමාණයක් රජය සතු වීම (50% කට වැඩි ප්‍රමාණයක්) සුළු කොටස් ප්‍රමාණයක් පෞද්ගලික අංශය සතුය. |
| ප්‍රාග්ධනය | රජය, පෞද්ගලික අංශය, මහජනතාව, සමුපකාර අංශය විසින් දැරිය හැකිය. |
| වගකීම | වගකීම අසීමිත වේ. එසේම රාජ්‍ය සංස්ථා රජයට අයත් වන බැවින් පාර්ලිමේන්තුවටත්, මහජනතාවටත් වගකිව යුතු වේ. |
| නෛතික පුද්ගලභාවය | නෛතික පුද්ගලභාවයක් ඇත. |
| කළමනාකරණය | ඇමතිවරයා විසින් පත්කරනු ලබන අධ්‍යක්‍ෂ මණ්ඩලයක් මගින් කළමනාකරණය කරයි. |
| පාලනය | පාලනය සිව් ආකාරයකට සිදු වේ.<br>1. ව්‍යවස්ථාපිත පාලනය (පනත් හෝ ගැසට් නිවේදන)<br>2. අමාත්‍යාංශ පාලනය<br>3. පාර්ලිමේන්තු පාලනය (පාර්ලිමේන්තු ගිණුම් කාරක සභාව, පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කමිටුව)<br>4. රජයේ විගණකාධිපතිගේ පාලනය |
| ලාභ බෙදීම | කොටසක් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කරන අතර කොටසක් ප්‍රති ආයෝජනය කෙරේ. කොටස් නිකුත්කර තිබේ නම් කොටස්හිමියන්ට ලාභාංශ ගෙවීම සිදු වේ. |
| ගිණුම්කරණය හා විගණනය | අනිවාර්යය වේ. |
| විසුරුවා හැරීම | පාර්ලිමේන්තුවේ සම්මත වූ යෝජනාවක් මගින් පහත පරිදි විසුරුවා හැරීම කළ හැකි වේ.<br>- සංස්ථාව මගින් ගිණුම් පියවා වසා දැමීම<br>- ඈවරකරුවෙකු හෝ ඈවරකරුවන් මගින් විසුරුවා හැරීම |

## රාජ්‍ය සමාගම්

මුළු ප්‍රාග්ධනයෙන් 50% කට වැඩි ප්‍රමාණයක් රජයෙන් හෝ රජයේ අනුපද්ධිත ආයතනයක් මගින් හා තිරිය පෞද්ගලික අංශය විසින් සපයා ඇති සමාගම් පනතට අනුව සංස්ථාපනයකර පවත්වාගෙන යනු ලබන ආයතන විශේෂය

1. රජයේ පෞද්ගලික සමාගම්
    - සී/ස විදුලිබල පෞද්ගලික සමාගම
2. රජයේ පොදු සමාගම්
    - ස්වාධීන රූපවාහිනිය

## රාජ්‍ය දෙපාර්තමේන්තු

පූර්ණ රාජ්‍ය හිමිකාරීත්වයක් සහ අමාත්‍යාංශ ගත පරිපාලයනක් යටතේ රාජ්‍ය ප්‍රතිපත්ති වලට එකඟව ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන ආයතන විශේෂය රජජ්‍ය දෙපාර්තමේන්තුව ලෙස හැඳින්විය හැකිය.

### ව්‍යාපාර කටයුතු වල නිරත රාජ්‍ය දෙපාර්තමේන්තු වල ලක්‍ෂණ

| | |
|---|---|
| අයිතිය | රජය සතුය |
| වගකීම | අසීමිත වේ. |
| අරමුදල් | වාර්සික අයවැය ලේඛනය මගින් ප්‍රදානය කෙරේ |
| කළමනාකරණය | ආයතන සංග්‍රහය, මූල්‍ය නීති සංග්‍රහය, අනුව දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් කළමනාකරණය සිදු කෙරේ. |
| පාලනය | පාර්ලිමේන්තු පාලනය<br>අමාත්‍යාංශ පාලනය |
| විගණනය | විගණකාධිපති විසින් අනිවාර්යයයෙන් සිදු කෙරේ. |
| නීතිමය කටයුතු | නීතිමය කටයුතු වලදී දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ නිල නාමයෙන් පෙනීසිටිය යුතු වේ. |
| ලාභාලාභ | රජය විඳ දරා ගනී (සියළු ආදායම් හා ලාභ රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කෙරේ.) |

## පළාත් පාලන ආයතන මගින් පවත්වාගෙන යන ව්‍යාපාර

ප්‍රාදේශීය සභා, නගර සභා සහ මහ නගර සභා යටතේ පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර වේ. පළාත් පාලන ආයතන හෝ මධ්‍යම රජය විසින් මූල්‍ය සපයයි. පාලනය පළාත් පාලන ආයතන විසින් සිදු කරයි.